# කෘෂි ජන ජීවිතයේ නවෝදය හා නගරයෙන් ගම කරා පුනරාගමනය අරභයා වූ සිංහල නවකතා

## (තෝරාගත් කෘති ආශ්‍රයෙන් කෙරෙන සංක්ෂිප්ත විමර්ශනයකි)

එස්. බී. අනුරුද්ධිකා කුමාරි කුලරත්න

The selected novels of this study distinctly mirror the social phenomena of the revival and restoration of agrarian society, and the retreat of the educated, urbane and extremely sophisticated protagonist to the simple Arcadian Village life, in search of roots. Thematic similarities and parallels could be observed between a Sinhala novel like **Akkarapaha** and contemporary Indian Fiction, for instance the Hindi novel **Godan** and the Indian English novel **The Sword and the Sickle**. Here, the emphasis is upon the candid and virginal purity of pastoral life not yet blemished by the urban life style which symbolizes a world of wealth and style that is ruthless and shallow, yet glittering and seductive. Geographically the isle of Sri Lanka is situated very close to her great neighbour, the sub-continent of India. Shared South Asian regional experiences, for example the common colonial legacy, play a prominent role in conditioning the social and cultural life of the natives. A consequnce of the newly found independence was that agrarian life was romanticized in contrast to the city life introduced by the colonial ruler.
The novels which represent the decade beginning from the year 1970 reflect the dominant political ideologies of the era. The concept of art for people sake came to the forefront during this period and its influence was cleary visible in the contemporary Novels. Human labour is glorified and made sublime. The role of the English educated protagonist who is contemptuous of and rejects the so-called white collar jobs and boldly steps into the field armed with the mammoty following his forefathers foot steps has become an essential icon in the motif of the story.

© **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එස්. බී. අනුරුද්ධිකා කුමාරි කුලරත්න**

සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු

**මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 22 කලාපය, 2014/2015**

මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය



සාහිත්‍යය එය පහළ වූ යුගය අරභයා වූ පර්යාලෝචනයක් වෙතියි යන සංකල්පයෙන් අදහස් කෙරෙන්නේ අදාළ අවධිය පිළිබඳ වූ සත්‍යයක් නොඑසේ නම් යථාර්ථවාදී නිරූපණයක් එහි ගැබ් විය යුතු බවය. **අක්කර පහ, අස්වැන්න, හෙයියම්මාරුව, නොයන් පුතුනි ගම හැරදා, මිහිසරණ, නිල්මල්විල,**[1] යන නවකථාවන්හි අන්තර්ගතය විමර්ශනය කිරීමේ දී ඒ කෘතිය වෙතින් ප්‍රතිබිම්බිත යුග යථාර්ථය සහ අදාළ කාල පරිච්ඡේදයන්හි රජයන ලද්දා වූ සාහිත්‍යයික මතවාද ව්‍යාපාර හා කතිකාදිය සම්බන්ධයෙන් භූමිකා යුගාවේණික සත්‍යය නියෝජනය කරන්නවුන් මෙන් ම තත් යුගයේ ජනයාගේ අපේක්ෂා කර පද්ධති ආදියෙහි පිළිබිඹු වශයෙන් ක්‍රියාත්මක වූ සැටි පෙනේ. පරිස්ථිතික ප්‍රවේශයකින් යුතු ව සාහිත්‍යකලාවක් විමර්ශනයෙහි ලා ප්‍රශංසාර්හ මෙහෙයක් ඉටු කළ මහාචාර්ය රේමන්ඩ් විලියම්ස්ගේ විචාර චින්තාවන්ට අනුකූලව නවකතාවකින් හුදු නිහඬ සමාජ ප්‍රතිබිම්බයක් ගෙනහැර පෑමකට වඩා වැඩියමක් එනම්, එක්තරා අයුරකින් සමාජය අර්ථ කථනය කිරීමක් සිදු වේ.[2] තව ද නවකතාව අදාළ යුගයේ ජනයාගේ හැඟීම්වල ව්‍යූහය(structure of feelings) ප්‍රතිබිම්බකය කරන අතර ම එය තත්ජන ප්‍රවාහයේ අදහස් ආකල්ප හා පුරුෂාර්ථයක් හැඩගැස්වීමට ගාමක ජවය සපයන උත්තේජනයක් ද වන්නේ ය.

සමාජයීය අත්දැකීම් පදනම් කර ගන්නා කලාකරුවා තත්කාලීන සමාජ යථාර්ථය සිය කෘතීන්ට විෂය කර ගනිමින් නිරන්තර සත්‍යය ගවේෂණයක යෙදේ. 1959 දී මුද්‍රණ ද්වාරයෙන් එළිබට මඩවල එස්. රත්නායකගේ අක්කර පහ නවකථාව තුළින් තත්කාලීන සමාජය අරභයා රචකයා ප්‍රත්‍යක්ෂ කරගත් සත්‍යයක් ධ්වනිත වේ. ස්වකීය නවකථාවේ සයවන මුද්‍රණයට ප්‍රස්තාවනාවක් සපයන කතුවරයා මතු දැක්වෙන අදහස ගෙනහැර පායි.

> "කවදා හෝ ජාතියේ සංවර්ධනය ඇති විය යුත්තේ අපේ ප්‍රධාන රක්ෂාව වන ගොවිතැන තුළින් ය යන අදහස මගේ සිත තුළ වැඩෙන්නට පටන් ගත්තේ මා සිදාදියට විත් එහි පදිංචි වූවාට පසුවයි. ආණ්ඩුවේ කන්තෝරුවක මුර සේවයේ යෙදෙන අයෙකුට ලැබෙන තැනක් වත් ගොවියාට නොලැබුණි. මේ හේතුව නිසා තම දරුවන්ගේ අධ්‍යාපනය ආණ්ඩුවේ

> රක්ෂාවකට පමණක් සීමා කිරීමට ඔවුන්ට සිදුවිය. උගැනීමක් ලැබූ තැනැත්තා ගොවියකු නොවිය යුතුය යන්න ඔවුන් තුළ වැඩී ගත් එක ම අරමුණයි. මේ එවකට තිබූ අධ්‍යාපනයේ වරද නිසා වූ දෙයක් ද එසේ නැත්නම් සමාජය තුළ වූ වරදකින් සිදුවූවක් දැයි අපි නොදනිමු. මගේ පියා කුඹුරේ වැඩ කරද්දී විනෝදය කතාවක් කුඹුරට බැසීමට මට අවසරයක් නොවීය. සී සානා විට කුඹුරට බැස නගුලක් අල්ලා හී විටක් ගැසීමේ ආශාව කොතෙක් මා තුළ වැඩුණ ද මපියා එතැන සිටින්නේ නම් එය කෙසේවත් කරන්නට මට ඉඩක් නොවීය. කිසියම් අධ්‍යාපනයක් ලබන තැනැත්තාට කුඹුරේ වැඩ අහිමිය යන්න ඔවුන්ගේ මතය වූ බව මා අවබෝධ කරගත්තේ කලක් ගියාට පසුවයි. ජීවත් වීමට ප්‍රධාන වශයෙන් අවශ්‍ය ආහාර ටික මෙහි ම නිපදවන තුරු අපට ලැබිය හැකි දියුණුව කුමක් ද? එවැනි අවශ්‍යතාවක් අපි ලබා ගත්තෙමු ද? ගොවිජන ව්‍යාපාරය පසුබිම් කොට ලියැවුණු මුල් ම නවකථාව මෙය වූ අතර ඒ මගේ මුල් ම නවකථාව ද වෙයි. අතපය වෙහෙසන තැනැත්තා අවාසනාවට තර්ජනයක් බව ඔප්පු කිරීමට මට මෙහි දී අවශ්‍ය විය."[3]

අක්කර පහ නවකථාවේ තේමාවත්, එහි රචකයා සමාජය පොදුවේ මනුෂ්‍යත්වය විෂයයෙහි හෙළනා ආකල්පය නොඑසේ නම් කර්තෘගේ ජීවන දෘෂ්ටිය කවරක් ද යන්නත් යථෝක්ත උද්ධෘතය හෙළි කොට සිටී. ශ්‍රී ලංකාව ස්වෛරීයත්වය දිනා ගැනුමට ආසන්න අවධියේ දී අභිනවයෙන් අරඹන ලද ගොවි ජනපද ව්‍යාපාරය හේතුවෙන් මෙරට කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ ඇති වූ නවම් ප්‍රබෝධය කර්තෘගේ නිරීක්ෂණාක්ෂියට නතුවෙයි. මෙහි දී නවකථා රචකයාගේ නිර්මාණවේගයට පසුතලය සපයන 1930 40 දශකයන්හි දේශීය කෘෂි ආර්ථිකයේ ප්‍රබෝධයක් ඇතිවීමට තුඩු දුන් දේශපාලනික මැදිහත් වීම් හා නව්‍ය නෛතික ව්‍යුහයන්හි සැකැස්ම පිළිබඳ අවබෝධයක් ලබාගැනීම වැදගති. 1920 දශකයේ අවසාන ඇති වූ ලෝක ආර්ථික පරිහාණියේ පීඩනය ලංකාවට ද අතිශයින් ම බලපෑවෙන් දේශීය කර්මාන්තය සංවර්ධන කිරීමට හේතු කාරක වන ප්‍රතිපත්ති සම්පාදනය වීමේ හා ඒවා ක්‍රියාත්මක කිරීමේ ප්‍රවණතාවක් 1929න් පසුව කරළියට පැමිණියේය.[4]



1929 වසරේ දී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම විසින් ඉදිරිපත් කරනු ලැබූ වාර්තාවට අනුව නව ඉඩම් ප්‍රතිපත්තියේ මුඛ්‍යාධ්‍යාශය වූයේ වී ගොවිතැන සඳහා ඉඩම් බහුල වශයෙන් උපයෝගී කර ගැනීමය. තව ද මෙම වාර්තාවෙන් අවධාරණය කෙරුණු අන්‍යතර වැදගත් කාරණා වූයේ ගොවිජනපද පිහිටුවීම මගින් වී ගොවිතැන සඳහා ඉඩම් යෙදවිය යුතු බවත් අක්‍රමිකතාවන්ගෙන් තොර ව රජයේ පූර්ණ අධීක්ෂණය යටතේ ඉඩම් විධිමත් ව බෙදා දිය යුතු පව සහ ඉඩම් බෙදා දීම පිළිබඳ නිසි බලධරයා ඉඩම් කොමසාරිස්වරයා වන බවත් ය.[5] 1930 වසරේ ගොවීන් ඉඩම්වල පදිංචි කිරීමේ පනත සම්මත වීමෙන් පසුව 1934 වන විට ඉඩම් අක්කර 50,000 ක් ගොවීන් අතර බෙදා දෙන ලද්දේය.[6] මෙසේ කෘෂකයන්හට ඉඩම් බෙදාදීම වේගවත් වනුයේ ගොවිජන ව්‍යාපාරය ආරම්භ වීමත් එහි ව්‍යාප්තියත් සමගය. 1931 වසරේ දී මින්නේරිය වැව ගොවිජන ව්‍යාපාරයට මුල්ගල තැබුණි 1935 දි ඉඩම් සංවර්ධන පනත සම්මත වීමෙන් පසු ගොවිජන ව්‍යාපාර පිහිටුවීම වඩාත් අවශ්‍යතා ජනපද ව්‍යාපාර උදෙසා සංරක්ෂිත වන භූමි සඳහා හා මහජන අවශ්‍යතා පූරණය අරමුණු කර ගනිමින් රජයේ ඉඩම් බෙදා දිය යුතු මනාය.[7]

අක්කර පහ නවකථාවට පාදක වන මිණිපේ ඇළ ගොවි ජනපද ව්‍යාපාරයේ සමාරම්භය සනිටුහන් වන්නේ 1939 දී එවකට කෘෂිකර්මාන්ත අමාත්‍ය ධූර්ය හෙබ වූ ඩී. එස්. සේනානායක මහතා විසින් මිණිපේ ඇළ සංවර්ධනය කිරීමේ කාර්යය උදෙසා විශේෂ පරීක්ෂණ කාරක සභාවක් පත් කරනු ලැබීමෙනි. එකී පරීක්ෂණ කාරක සභාව ඉදිරිපත් කළ වාර්තාව අනුව දෙවසරක් ඇතුළත දී අක්කර දහස් ගණනක් ජලාශ්‍රිත කිරීමටත් පවුල් සිය ගණනක් පදිංචි කරවීමටත් යෝජනා වී තිබුණි.[8] එකී යෝජනා ක්‍රියානට නගමින් දියත් වූ මිණිසේ ඇළ සංවර්ධන වැඩ පිළිවෙළේ දී පළමුවන අග්බෝ රජ දවස (571-604) තනවන ලද සැතපුම් හතළිස් පහක් දිගු වූ පැරණි ඇළ මාර්ගය ප්‍රකෘතිමත් කිරීමට පියවර ගැනිණි. තදාශ්‍රිත අක්කර දහස් ගණනක පරිශ්‍රය ද මෙයින් ජලාශ්‍රත විය. හතළිහ දශකයේ ලාංකේය කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ අභිනව ප්‍රබෝධයට ප්‍රබල උත්තේජනයක් වශයෙන් ක්‍රියාත්මක වූ තවත් කාර්යයක් වන්නේ 1948 දී එවකට බලයේ සිටි රජය විසින් ප්‍රකාශයට පත් කෙරුණු සය අවුරුදු සැලසුමයි. මෙයින් කෘෂකයන්ට වඩාත් දියුණු

කළ හා නවීන උපකරණ භාවිතය හඳුන්වා දීම මගින් ශෂ්‍ය ඵලදාව වැඩි කර ගැනීමත් වගා කිරීමට යොදා ගැණෙන භූමි ප්‍රමාණය සය වසරක් තුළ අක්කර 1,31,000 ක් වර්ධනය කිරීමත් අපේක්ෂිත විය.[9] 1948 දී ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමත් සමග රජයේ ඉඩම් පවරා දීම සීඝ්‍රතර විය.

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගේ පාලන තන්ත්‍රයෙන් මිදී ස්වෛරී රාජ්‍යයක් වීමෙන් අනතුරු ව දේශීය වී නිෂ්පාදනය වැඩිවීම උදෙසා යම්බඳු සාධනීය බලපෑමක් 1958 දී කුඹුරුපණත ක්‍රියාත්මක වීම තුළින් සිදුවිය. හතළිහ පණහ සහ හැට දශකයේ මැද භාගය දක්වා වී නිෂ්පාදනය වැඩිවීම කෙරෙහි මුඛ්‍ය බලපෑමක් කළ සාධකයක් වශයෙන් ඩී. ආර්. ස්නොඩ්ග්‍රාස් නම් ආර්ථික විශේෂඥයා හඳුනා ගන්නේ වී බුසලක් උදෙසා සහතික මිල ක්‍රමය ක්‍රියාත්මක වීමයි.[10]

රාජ්‍ය අංශය මගින් දෙවුණු මූල්‍යානුබලයන් ද 40 - 50 දශකයන්හි මෙරට වී නිෂ්පාදනයෙහි සැලකිය යුතු ප්‍රමාණාත්මක ප්‍රගතියක් ඇතිවීමට තීරක සාධකයක් ලෙස ක්‍රියාත්මක විණි. ගොවීන් මුහුණදෙන මූලික අභියෝගයක් වන මූල්‍ය ප්‍රාග්ධනය සපයා ගැනීමේ ගැටලුවට යෙදුණු පිළියමක් වශයෙන් 1948 දි රජය මගින් කෘෂි අංශයට ණය සැපයීම ආරම්භ විය. 1945 දී කෘෂි නිෂ්පාදන හා අලෙවි සමූපකාර සමිති මගින් කෘෂි අංශයට ණය සැපයීමේ කාර්යයභාරය ද ඉටු විය. 1952 වසරේ සිට ආහාර නිෂ්පාදන දෙපාර්තමේන්තුව කෘෂි අංශයට ණය ප්‍රදානය කිරීමේ කර්තව්‍ය භාරගත් අතර එය ගොවිජන සේවා දෙපාර්තමේන්තුව පිහිටුවන තෙක් ක්‍රියාත්මක වූයේය.[11] 1957 දී ලාංකික ග්‍රාමීය ණයගැතිභාවය අරභයා සමීක්ෂණයක් සිදු කෙරුණු අතර එයින් අනාවරණය වූ තොරතුරු මත පිහිටා අංග සම්පූර්ණ පදනමක් මත ග්‍රාමීය ණය පහසුකම් සැලසීමේ අරමුණින් දිවයින පුරා විවිධ සේවා සමූපකාර සමිති ආරම්භ කෙරිණි. එයින් සමූපකාර ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීමත් ග්‍රාමීය අංශයට ණය සැපයුම වඩාත් ක්‍රමවත් හා විධිමත් පිළිවෙතකට අනුව සිදු කිරීමත් යන කාරණා ද්වය සපුරා ගැනිණි.[12] හතළිහ පණහ දශකයන්හි වී නිෂ්පාදනය වර්ධනය වීම කෙරෙහි ප්‍රබප ව බලපෑ තවත් සාධකයක් වූයේ කෘෂි පර්යේෂණ ආයතන ආශ්‍රේය කෘෂි පර්යේෂණ කටයුතුය. 1948 දි බ්‍රිතාන්‍ය යටත් විජිත



පාලනයෙන් මිදී නිදහස දිනා ගැනීමෙන් පසුව වියළි කලාපීය ප්‍රදේශයන්හි වගා කටයුතු වැඩි දියුණු කිරීමේ අභිලාෂය පෙරදැරි ව අවශ්‍ය පර්යේෂණාදිය සිදු කිරීමට 1949 දී මහ ඉලුප්පල්ලම කෘෂි පර්යේෂණ ආයතනය පිහිටුවන ලද්දේය. 1954 දී පිහිටු වූ බතලගොඩ වී පර්යේෂණායතනය විසින් ලංකාවේ විවිධ ප්‍රදේශයන්හි දේශගුණික තත්ත්වයවයන්ට පසෙහි ස්වභාවයට විවිධ කෘෂි පළිබෝධයන්ට පොහොර වර්ගවලට අනුරූපී වන අයුරින් නව වී වර්ග ගණනාවක් ම හඳුන්වා දෙනු ලැබීය.[13] 1950 වසරේ දී ආරම්භ කළ පොහොර සහනාධාර ක්‍රමය ගොවිනත්‍ර පොහොර භාවිතය වැඩි කිරීමට තුඩුදෙන උත්තේජකයක් ලෙස ක්‍රියාත්මක වූයෙන් අනිවාර්ය ප්‍රතිඵලයක් ලෙස දේශීය වී නිෂ්පාදනය වැඩි වීමක් සිදු විය.[14]

මඩවල එස්. රත්නායක විසින් 1959 දී රචිත අක්කර පහ නවකථාවෙන් හුවා දක්වෙන මිණිපේ ගොවි ජනපදය ආශ්‍රිත කෘෂක ජනජීවිතයේ උද්දීප්තිය කතුවරයාගේ හුදු පරිකල්පනයේ අහඹු ප්‍රතිඵලයක් නොව, අදාළ යුගයේ ලාංකේය කෘෂි ආර්ථිකයේ තථ්‍ය පිළිබිඹුවක් බවට යථෝක්ත ඓතිහාසික සාධක සාක්ෂ්‍ය එළවයි. කලාව එය පහළ වූ යුගයේ පර්යාවලෝචනයක්ය යන ප්‍රවාදය සමර්ථනය කෙරුමට 1940 - 1950 දශකයන්හි අපේ සමීපතම අසල්වැසියා වන භාරත දේශයේ පහළ වූ කලා මාධ්‍ය වෙතින් මෙහිලා විශේෂයෙන් තත් කාල පරිච්ඡේදයෙහි බිහි වූ සිනමා නිර්මාණ ආශ්‍රයෙන් සාධක සොයාගත හැකිය. 1947 වසරෙහි දී දෙවන ලෝක සංග්‍රාමයේ අවසානයක් සමග ම බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙහි පාලනයෙන් මිදී ස්වරාජ්‍ය දිනාගත් නිදහස් භාරතයේ ජාතික රාජ්‍ය සංකල්පය සැකසුණේ එහි ප්‍රථම අමාත්‍යවරයා වූ ජවහර්ලාල් නේරුගේ ලෞකික රාජ්‍යය පුරවැසිභාවය සමානාත්මතාව අධ්‍යාපනය සහ තාක්ෂණික සංවර්ධනය යන උපාංගයන්ගෙන් සමන්විත වූ නේරුවියානු දර්ශනය යනුවෙන් අර්ථ නිරූපණය වූ පදනම මත්තෙහිය.[15] ස්වරාජ්‍යය දිනා ගැනීමෙන් පසු ඇති වූ උග්‍ර දුර්භික්ෂය හේතුවෙන් ඇමෙරිකාවෙන් ධාන්‍ය ආනයනය කිරීමට සිදුවීම. වාමාංශික නායකත්වයකට නතු වූ කේරළයේ ආන්ද්‍රා ප්‍රදේශයේ හා බෙංගාලයේ උද්ගත ගොවි කැරළි යන මේ සංක්ෂෝභයන් නව ජාතික රාජ්‍ය මුහුණ දුන් ප්‍රබලතම අභියෝග ද්වය විය. නේරුවියානු සමාජවාදී හා ලෞකික රාජ්‍යදර්ශනය හා

එකඟ වෙමින් පස් අවුරුදු සැලසුම වැනි සැලසුම් ආකෘති මගින් ජාතික ප්‍රගතියේ කෙටුම්පත සකස් කරනු ලැබීය. අභිනවයෙන් ස්ථාපිත යකඩ හා වානේ කර්මාන්ත ශාලා නූතන භාරතයේ නවීනත්වයේ සංකේත වශයෙන් දුටු නේරු චිරන්තන කෘෂි කර්මාන්තයේ ප්‍රවර්ධනයට තුඩු දෙමින් ගංගා හරස්කොට තැනූ වේලි අනාගත භාරතයේ පූජාර්හ දෙවොල් වනු ඇතැයි යනුවෙන් ජාතිය අමතා උදම් ඇණීය.[16] හරිත ඉන්දියාවක් සඳහා වූ නේරුගේ දේශපාලන සිහිනය බොලිවුඩ් රිදීතිරයේ ඊස්ට්මන් වර්ණයෙන් මැවීමට උත්සුක වූ මෙහෙමුඩ් ඛාන් නම් සිනමා අධ්‍යක්ෂකවරයා විසින් භාරත මාතා (1957) චිත්‍රපටයෙන් ග්‍රාමීය කෘෂි ජන ජීවිතය උත්කර්ෂයට නංවා සම්ප්‍රදායික මව් ගෙවිලියගේ භූමිකාව පූජාර්හභාවයට පමුණුවන ලද්දේය. අනෙක් පසින් බිමල් රෝයිගේ **දෝබිගා ජමීන්** (1953) චිත්‍රපටයේ දී ණයගැති බවින් පීඩිත ගැමි කෘෂකයෙකු නගර හා ගම් යා කරමින් නේරුගේ රජය විසින් තැනූ මං පෙත් ඔස්සේ නගරයට ඇදී එන්නේ රික්ෂෝකරුවකු වශයෙන් ක්‍රියාකොට ජීවිතය ගැටගසා ගැනීම උදෙසාය. මීටත් ප්‍රථමයෙන් සත්‍යජිත් රායිගේ අපරාජිතෝ (1956) හා අපූසංසාර් (1959) හි දී වැදගත් සමාජ සංචලයක් සෙලියුලොයිඩ් පටලය මත චිත්‍රණය කෙරුණේ නව යථාර්ථවාදී රීතිය මත පිහිටා සිනමා සෞන්දර්යවේදය හසුරුවෙමිනි. යථෝක්ත සමාජ පෙරළිය අදාළ චිත්‍රපටයන්හි සනිටුහන් ව ඇත්තේ අපූ නම් ගැමි කථානායක දරුවා අධ්‍යාපනය උදෙසා ගම අතහැර මහා නගරයෙහි පදිංචියට යැමෙහි සිද්ධිය පදනම් කොට ගනිමිනි. බොම්බායේ නිෂ්පාදිත පෙර කී ප්‍රධාන ධාරවේ වාණිජ චිත්‍රපට වෙතින් නගරය දෝතින් දරා සිටි නව්‍යතර අවස්ථා හා වෘත්තීන්ට ආශක්තව ගම හැර දමා පැමිණි ගැමි කෘෂක තරුණයාගේ අකුටිලත්වය අව්‍යාජත්වය හා සදාචාරශීලීභාවය අවධාරණය කෙරුණු අතර ඔහුගේ මූලයන් කිඳාබැස තිබුණු ගම චිරන්තන සම්ප්‍රදාය හා සත්භාවය නියෝජනය කෙරෙන පරමාදර්ශී තත්ත්වය ලෙස හුවා දක්වා තිබිණි. එයට ප්‍රතිපක්ෂ ව නගරය නාගරික ජීවිතය නො එසේ නම් නූතනත්වය දුෂ්ට හා අසත්භාවයෙන් පිරිපුන් ප්‍රපංචයක් වශයෙන් අවධාරණය වී තිබිණි. අවසාන කථානායකයා නාගරික ජීවිතය කෙරෙහි උකටලී සිතැති ව ගම කරා පුනරාගමනය කරයි.



ප්‍රථම යථාර්ථවාදී හින්දී නවකතාකරුවා වශයෙන් ගැණෙන ප්‍රේම් චාන්ද් විසින් 1936 වසරෙහි දී රචිත **ගෝදාන්** නවකථාවෙහි දී දිළිඳු අඥ ගොවි ජනකායගේ ජීවිතයේ ගැබ් වූ ඛේදනීයත්වය නිරූපණය වේ. එතෙකුදු වුව එහි දී වීරත්වයට නැංවෙන්නේ සුළු වෙළෙන්දකු වීම පිණිස සාම්ප්‍රදායික ගොවිකම අතැ'ර නගරයට සංක්‍රමණය වන කැරලිකාරී ගෝබාර් නම් මාණවක භූමිකාව නොවේ. ගමෙහි ම රැඳී ගොවිකමට හිමි අනේක විධ පිරිසක උසුලමින් සියල්ල දෛවෝපගත වන්නේය යන සංකල්පය මත පිහිටා ජීවනාභියෝගයන් නොකොඳුරා උසුලා සිටින 'ගෝරි' නම් මහලු ගොවියාය. ගෝබාර් සිය මව්පියන්ගේ සුවදුක් විමසන අටියෙන් මඳ කලකට සිය ජාත ග්‍රාමයට පැමිණ පෙරළා ලක්නව් නගරයට පැමිණෙයි. එවිට ඔහු වෙළඳපළෙහි තම වෙළෙඳාම් ස්ථානය අනිකකු විසින් පැහැර ගෙන ලැබ ඇති බව දනියි. නගරයෙන් බැහැර ව සිටි සුළු කාලය ඇතුළත ඔහුගේ පාරිභෝගිකයන්ගේ මතකයෙන් ඔහු ගිලිහී ගොසිනි. මීට ප්‍රතිපක්ෂ ව ගෝබාර්ගේ ගමෙහි ගැමියෝ වසර ගණනාවක ඇවෑමෙන් වුව ගෝබාර් දුටු මනතින් ඔහු හඳුනාගෙන ඔහු සුහදශීලී ව අල්ලාප සල්ලාපයෙහි යෙදෙති. මෙසේ නවකථා රචකයා චපන නාගරිකයන් සම්බන්ධයෙන් ගෝබාර්ගේ සිත්හි නිපන් කලකිරීම තුළින් නගරයේ වියළි කර්කශ දැඩි කෘත්‍ය සාධකවාදී (pragmatic) මානව සබඳතාවයන්ට එදිරි ව ගැමියන් සතු ළතෙත් බව හා සුහදශීලීත්වය හුවා දැක්වීම පෙලඹී ඇත. ප්‍රේම් චාන්ද් ගෝදාන් නවකථාවෙහි ස්ත්‍රී චරිත නිරූපණයේ දී බෙලාරි ග්‍රාමයෙහි ඉඩම් හිමි සමින්දාර්වරයාගේ ආගන්තුකයකු වශයෙන් නගරයෙන් පැමිණෙන මාලතී නම් බටහිරකණය වූ ස්ත්‍රියට ප්‍රතිපක්ෂ ව සාම්ප්‍රදායික ගැමි යුවතියගේ පෞරුෂය සතු ප්‍රබලත්වය අවධාරණය කිරීමට ද මෙහෙය වේ. ප්‍රේම් චාන්ද් විසින් කාන්තාමය ගුණයෙන් පිරිපුන් යැයි උත්කෘෂ්ටාකාරයෙන් නිරූපිත ඕ නිර්ව්‍යාජ ගුණයෙන් නොතොර වන්නී ආගන්තුක සත්කාරයෙහි ද අන්‍යයන්ට ආධාරෝප කිරීමෙහි ලා ද අතිශය උද්යෝගයකින් යුතු ව ඉදිරිපත් වන්නීය. මෙයට සමාන්තර ව නාගරික මාලතී සතු ව ඇත්තේ නොගැඹුරු පෞරුෂයකි. ඇය ආත්මාර්ථකාමීය. සුළු කරුණකට වුව වහා කෝප ගන්නීය. හිරු එළියට මඳත් නිරූපණය වූ විටෙක පවා ඇය දරුණු හිසරාජාවකින් පෙළෙන්නීය. ප්‍රේම් චාන්ද් ස්ත්‍රීන් දෙදෙනාගේ පරස්පරය රූපාත්මක ව නිරූපණය කරන්නේ මෙසේය.

එකියක නැවුම් වන මලක් ලෙසින් සුපුෂ්පිතය. අනෙකිය මල් බඳුනක රෝපිත මල් පැලයක් ලෙසින් ප්‍රබලය. කුඩාය.[17]

ප්‍රේම් චාන්ද්ට සමගාමී ව මුල්ක් රාජ් ආනන්ද් විසින් හතළිහ දශකයෙහි රචිත **Sword and the Sickle** හා **Lalu Trilogy** වැනි නවකථා වෙතින් ද නාගරික ජීවිතයට සාපේක්ෂ ව කෘෂක ජීවිතය ඇගයීමට පාත්‍ර වේ. විශේෂයෙන් ම නවසිය හතළිස් පහ පණහ කාල සීමාව වන විට විනෝභා භාවේ වැනි සමාජ සේවකයකුගේ පුරෝගාමිත්වයෙන් ආරම්භ කෙරුණු **භූදාන්, ශ්‍රමදාන්, සම්පත්තිදාන්** හා **ජීවන්දාන්** යන ඉඩම් ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයන්හි අභිප්‍රාය වූයේ පොදුවේ ඉඩම් හිමියා මෙන් ම අඳ ගොවියා හට ද ඉඩමේ භුක්තිය සම සම ව භුක්ති විඳිය හැකි ක්‍රමවේදයක් සැකසීමය. එමෙන් ම ජනතා සිත්සතන්හි කෘෂිකර්මාන්තය විෂයයෙහි යළි උද්‍යෝගයක් විශ්වාසයක් ජනිත කරවීමය. විනෝභාගේ ආදර්ශ පාඨය වූයේ '**ග්‍රාමීන් සුඛී හම් සුඛී**' යන්නයි. එනම් 'ගැමියන් සැපසේ වෙසෙත් නම් එය අපගේ සැපත වේ' යන්නයි. මෙබඳු ප්‍රගතිශීලී ව්‍යාපාරවල දෘෂ්ටිවාදාත්මක ආභාසය සමකාලීන භාරතීය නවකථා මත පතිත ව තිබෙනු නිරීක්ෂණය කළ හැකිය.

මෙනයින් ශ්‍රී ලංකාව හා භාරතය යන යටත් විජිතකරණයට පාත්‍ර ව අභිනවයෙන් දේශපාලන නිදහස ලද දේශයන් දෙකක එක සමාන කාල පරිච්ඡේදයක (1940-1960) එක සමාන ප්‍රස්තුත සාහිත්‍ය කලාදියට වස්තු නිධව වීමෙන් හැඟෙන්නේ තත් රටවල් දෙකට පොදු වූ දක්ෂිණ ආසියාතික කලාපීය සාම්‍යත්වයයි. එමතු නොව සමාජ සත්‍යය සාහිත්‍ය කලා නිර්මාණ තුළින් කෙතෙක් දුරට උකහා ගත හැකි ද යන්න අරභයා යම් ඥානයක් මෙන් ම කලා කෘතියක් එය පහළ වූ යුගයේ සමාජ ආර්ථික බලවේග අතර ඇති කරගන්නා අන්තර් ක්‍රියාව පිළිබඳ ව යථාවබෝධයක් යථෝක්ත කාරණා විමංසනය කිරීමේ දී සම්පාදනය වනු ලැබෙයි.

අක්කර පහ නවකථාවෙහි කථානායකයා වන සේන මැදවත්ත සත්කෝරළයට අයත් පිටිසරබද සාමාන්‍ය ගොවි පවුලක එක ම පුත්‍රයා ලෙස උපන්නෙකි. ඔහුගේ පියා වන බණ්ඩා අතීතයෙහි සමන්තැන්න ගමෙහි තරමක පොහොසත් ඉඩම් හිමි ගොවියෙකු



වුව ද සුළු ඉඩම් හබයකට පවා නඩු මඟට බැසීමේ ප්‍රතිඵලයක් ලෙස දිළින්දකු බවට පත්වෙයි.

ගොවිතැනින් ජීවත් වන බණ්ඩා එදා ගමේ සැහෙන තරමක පොහොසතකු වුව ද, අද තම පවුල රැක ගන්නේ මඳක් කරදරයෙන්ය. ගොඩමඩ ඉඩකඩම් රාශියක් බණ්ඩාට එදා අයත් ව තිබුණ ද දැන් ඒවායින් ඉතිරිව ඇත්තේ නිතුල්මුණුව කුඹුරත්, ඉන්නා වත්තත් පමණි. ඉතා කුඩා දේකට පවා නිසි කටයුතු කරන බණ්ඩා අද දිළිඳු අඩියකට පත් වී ඇත්තේ නඩු මඟට බැසීමේ ප්‍රතිඵලයක් වශයෙනි. එක පොල් ගසක් බේරා ගැනීමට නඩු මඟට බසින බණ්ඩා අක්කර ගණන් විකිණී යන තුරුත් ඒ සටන ගෙන යයි. යම් නඩුවකින් පරාජය වුව ද කනස්සලු නොවන ඔහු එම නඩුවට පෙනී සිටි නීතිඥයන්ගේ දස්කම් ආදිය කියාපාමින් සතුටු වෙයි.[18]

නඩු මඟට බට බණ්ඩා දිළින්දකු වීමේ සිද්ධිදාමය බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන තන්ත්‍රය විසින් පැරණි ගම්සභා ක්‍රමයට නෛතික ආදේශකයක් වශයෙන් හඳුන්වා දෙන ලද අධිකරණ ව්‍යුහයේ සරණ සොයා ගොස් අතරමං වූ දේශීය ගැමි පංතිය සංකේතාකාරයෙන් නිරූපණය කරන්නකි.

සාම්ප්‍රදායික කෘෂි අර්ථ ක්‍රමය මත පදනම් වී පෙර දින ස්වයංපෝෂිතභාවයට උරුමකම් කී සමන්තැන්න ගම කාලයාගේ ඇවෑමෙන් සමාජාර්ථික අවසඟත්වයට පත්වේ. ගමට බාහිරින් පැමිණි නව වාණිජ බලවේග සූක්ෂ්මාකාරයෙන් ගමේ ම ස්ථාපිත වී ගමෙහි ස්වයංපෝෂිත කෘෂි අර්ථ රටාවට මරු පහරක් එල්ල කරන අනුක්‍රමයෙන් එය විනාශ මුඛය කරා රැගෙන ගිය සැටි දිසාවේ නැමැත්තාගේ චරිතය තුළින් කර්තෘ නිරූපණය කරයි. සමන්තැන්න ගමෙහි මහා ධනවතා වීමේ ඉලක්කය කරා පියවරෙන් පියවර දිසාවේ ළඟා වූ සැටි මෙසේ අනාවරණය වේ.

අනුන්ගේ ඉඩම් අමු අමුවේ මෙන් කොල්ල කා ගත් මොහු පිටගම්කාරයෙකි. මයියොක්කා පෙති වෙළඳාමෙන් ජීවිතය ආරම්භ කළ මොහු පසුව සමන්තැන්නේ තරුණියක සමග විවාහ විය. ඔප්පු තිරප්පු කිසිවක් නොමැති ව පරවේණි ලෙස භුක්ති විඳගෙන ආ

ගම්මුන්ගේ ඉඩම්වලට තම බිරින්දෑ උරුමක්කාරී කොට ඉදිරිපත් කළ මොහු මේ ඉඩම් උරුම කර ගන්නේ බොරුවෙනි. කවර අන්දමකින් ඔහු පොහොසත් වුව ද දූන් ගමේ කවුරුත් ඔහුට සලකති. ගම්මුන් දෙදෙනෙකු අතර ඉතා සුළුවෙන් හෝ ආරවුලක් ඇති වූ විටක දී එය ඉතා විශාල දෙයක් කොට පෙන්වන මොහු ඔවුන් නඩු මඟට බැස්සවීමට කටයුතු සලස්වයි. එවැන්නක් කිරීමෙන් ඔහු විනෝදයට පත් වන්නේ යැයි අපට සිතෙතත් ඒ විනෝදයෙන් අපට නොපෙනෙන දුර ඔහු බලයි. නඩු මඟට බව කෙණෙහි එක් පක්ෂයකගේ හෝ ඉඩමක් විකිණී යන බව හෝ උගසට බැඳෙන බව හෝ ඔහු දනී. දෙපක්ෂයක් නඩු මඟට බව විට දුබල පක්ෂයට හිතවත් වීම ඔහුගේ සිරිත ය. මේ අනෙකක් නිසා නොව ඔහුගේ ඉඩම කෙසේ හෝ අයත් කරගත හැකි බව දිසාවේ දන්නා හෙයිනි... දිසාපති තමා යැයි දූන් ගම්මුන් ව්‍යවහාර කරතත් එවැනි නිලයක් මොහුට නොමැත. මයියොක්කා කද ගෙන යද්දී දිසාපති නමින් අමතන්නට පුරුදු වූ ගම්මු ඔහු කත් වෙළඳාම නවත්වා ඉඩම් හිමියකු වශයෙන් සැපවත් ජීවිතයක් ආරම්භ කළ පසු දිසාපති තුමා යනුවෙන් අමතන්නට පුරුදු වූහ.[19]

බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන අධිකාරිය 1832 වර්ෂයේ දී හඳුන්වා දුන් කෝල්බෲක් හා කැමරන් ප්‍රතිසංස්කරණයන්හි කේන්ද්‍රීය පරමාර්ථය වූයේ මෙරට ධනවාදී අර්ථ ක්‍රමයක් ස්ථාපිත කිරීමය. පාරම්පරික අර්ථ ක්‍රමය තුළ මූලික වශයෙන් යැපීම සඳහා උපයෝගී වූ ඉඩම් හා ශ්‍රමය වෙළඳපොලේ ඉල්ලුම හා සැපයුම ආදියට පාත්‍ර වූ සාධක බවට පෙරළිණි. වාණිජවාදී ඕඝය මෙරට ගම් දනම් සිසාරා යත් ම අතීතයේ රාජකාරී ක්‍රමය මත ස්ථාපිත ව තිබූ සාමූහික පැවැත්ම විඝටනය වී පෞද්ගලිකත්වය නම් අභිනව පුරුෂාර්ථය ධනේශ්වර වන්දනාවෙහි නියැළුණු ධනකාමීහු සාදරයෙන් වැළඳ ගත්තාහුය. මගේ සල්ලි, මගේ ඉඩම් යන මමායනය පෙරටු කර ගත් පෞද්ගලිකත්වය හා උනුන් අබිබවා ආර්ථික වූ හෝ සාමාජික ව ඉහළ නගින්නට ඇතිවන විජිගීෂාව, නගර කේන්ද්‍ර කරගත් ආර්ථික පිළවෙතේ අග්‍රඵල විය. සිවුදෙසින් ධන ගංගා කලා ආවත් 'සිදාදිය' අතෘප්තිමත්ය. ඒ අතෘප්තියේ සෙවණැල්ල 'සමන්තැන්න' වැනි ප්‍රත්‍යන්ත ගමකට පතිත වූයේ පෙර නොවූ විරූ පරිදි හැකිතාක් ඉඩම් පෞද්ගලික සන්තකයට ගැනීමේ 'තෘෂ්ණාව' මුල්කර ගනිමිනි. දිසාවේ වැනි නගරයෙන් ගමට සංක්‍රමණය වූ වාණිජ බලවේගයේ



නියෝජිතයෝ ගැමියන් තෘෂ්ණා ව්‍යාධියෙන් ආසාදනය කර කෙළවර ඔවුන් අසාධ්‍යයන් කළ රෝග වාහකයෝ ලෙස ක්‍රියාත්මක වූහ. ගැමි දරුවකු වූ සේනට ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා දී කාලානුරූපී ව ඔහු ලොක්කෙක් කරවීම මැදවත්ත දම්පතීන්ගේ ඒකායන ප්‍රාර්ථනයයි.

> "... අපිට ඉන්නෙත් එක කොල්ලයි. ඉතින් ඒකටවත් හරියට උගන්වන්න එපායැ..."
> "... අපේ දුප්පත්කම තිබුණත් මට ඕනෑ කරන්නේ කොහොම හරි උඹ ලොකු මිනිහෙක් කරන්නයි.."[20]

බ්‍රිතාන්‍යයන් විසින් හඳුන්වා දුන් වතු වගා ක්‍රමයේ වර්ධනයත් සමග ම එකී වගාවන්ට අවශ්‍ය වූ මාර්ග තැනීම ගොඩනැඟිලි ඉදිකිරීම, ප්‍රවාහන කටයුතු හා භාණ්ඩ සැපයීම ආශ්‍රිත සුළු වෙළෙඳාම් හා නොයෙක් ශිල්ප ක්‍රම පැන නැගිණි. ආරම්භයේ දී වතු වගාවන්ට අවශ්‍ය සේවාවන් සැපයීමට ඉදිරිපත් වූ කාර්මිකයන් කොන්ත්‍රාත්කරුවන් පසු ව වෙළෙඳුන් මිනිරන් පතල් හිමියන් රේන්දකරුවන් හා වතු හිමියන් බවට පත්වීම සැලකිය යුත්තකි. මේ සමග ම ධනවාදී ආර්ථික සම්බන්ධතාවල අනිවාර්ය අංශය වන වෙළඳ සමාගම් බැංකු ආදියත් පෞද්ගලික දේපළ සම්බන්ධයෙන් වූ නීතිරීති ආදියත් ශීඝ්‍රකාරයෙන් වර්ධනය විය. මේ තත්ත්වය යටතේ ලිපිකරුවන් නීතිඥයන් වෙළඳුන් හා සුළු පරිපාලක තනතුරු දරූ නිලධාරීන්ගෙන් සමන්විත මධ්‍යම පංතියක් ලංකාවේ පහළ විය. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගේ වාණිජ හා පරිපාලනමය ක්‍රියාමාර්ග හේතුවෙන් බාහිර වශයෙන් ඇති වූ බලපෑම්වල ප්‍රතිඵලයක් වශයෙන් බිහි වූ මෙරට මධ්‍යම පංතිය සෙසු සමාජ ස්තරයන්ගෙන් වෙන් කොට හඳුනා ගත හැකි වනුයේ ඊට ම පොදු වූ සුවිශේෂ අංග ලක්ෂණවලින් සමන්විත වූ බැවිනි. සාමාන්‍ය ජනතාව වෙතින් ද දේශීය රාජකාරී සමාජ අර්ථ ක්‍රමයෙන් පැවත ආ ඇතැම් රදල ප්‍රභූ කොටස්වලින් ද මේ පංතිය වෙන් ව කැපී පෙනෙන්නා වූ අංග ලක්ෂණ වූයේ ප්‍රමුඛතර ව ඉංග්‍රීසි අධ්‍යාපනය හා ඒ සමග බැඳී පැවති විශේෂ තත්ත්වය වත්පොහොසත්කම් බටහිර චින්තාවලි, සිරිත් විරිත් හා පෞරුෂ විලාසය යන මේවාය. මේ වකවානුවෙහි සමාජ ගෞරවය අභිසරණය වෙමින් තිබුණේ ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලැබ එහි අනිවාර්ය ඵලයක් වශයෙන් 'සුදු කරපටි' රක්ෂාවන්හි නියැළී මධ්‍යම පංතික වෘත්තිකයන් වෙතය.

වෙනස් වන සමාජ දහම් වහා සංජානනය කරන සේනගේ මාපියෝ දේපළ ඉඩකඩම් විකුණා ණය ගෙවා ගත නොහී මහ මඟ සිඟා කෑමට සිදු වන්නේ වී නමුත් සිය පුත්‍රයට ඉංග්‍රීසි මාධ්‍යයෙන් උසස් අධ්‍යාපනය ලබා දිය යුතු යැයි නිශ්චය කරති. මාපියන්ගේ ප්‍රාර්ථනයට හිස නමා ඔවුන්ගේ යසස් කාමය තෘප්තිමත් කරවීමේ ආධ්‍යාශය පෙරදැරි ව සේන මහනුවර ඉංග්‍රීසි විද්‍යාලයකට ඇතුළත් වෙයි. ගමෙන් නගරයට වන් සේන මුහුණ දෙන්නේ පීඩාකාරී සංස්කෘතික ගැටීමකටය. පෙර දී දෙමව්පියන් ඇසුරෙහි ශික්ෂිත ජීවිතයක් ගත කළ ඔහුගේ නිජ ගැමි ගතිගුණ නාගරික සිරිත් හා දහම් සමගින් සට්ටනය වේ. ගැමි පිරිත් පූර්ණ වශයෙන් බැහැර ලා නාගරික සිරිත් කරට ගැනීමට තතනන ප්‍රයත්නයට සරසක් ව සිටිනුයේ ඔහුගේ දිළිඳුකමයි. මෙසේ ගැමි සංස්කෘතික ලක්ෂණ වෙතින් මිදිය නොහැකි වීම නිසාත් නාගරික සභ්‍යත්වයට අවශෝෂණය වී එයට අනුගත වීමට තරම් අවශ්‍ය මුල්‍යමය ප්‍රේරණයක් නොලැබීම නිසාත්, ඔහු තත් ලෝක ද්වය අතර මංමුළා වූවකු බවට පැමිණේ.

> "කල් යත් යත් අළුත් ලෝකයේ ජීවත් වීම සේනට ද පුරුදු විය. අනුකරණයෙන් හොඳ පුහුණුවක් ගත් කරගත් සේනට ඔවුන් සමග එකට දවසැරීමට දුන් පුලුවන. එහෙත් ඔවුන් හා උරෙන් උර ගැටී ජීවත් වීමට ඔහුට දුප්පත්කම හරස් කපයි. ඔහු බොහෝ අවස්ථාවල ඔවුන් හා ජීවත් වූයේ තටු සිඳී ගිය කුරුල්ලකු රංචුවක් මැදට වී සිටින්නාක් මෙනි."[21]

සිය නිජ සංස්කෘතික පරිසරයෙන් ඈත් කොට බටහිර අධ්‍යාපන ක්‍රමය තුළින් දැනුම වැඩීමේ ආනුශංගික ඵලයක් වශයෙන් සේන නිරායාසයෙන් ම පරිචයක් ලබන්නේ බටහිර පිළිවෙත් අකුරට ම අනුකරණ මාර්ගයෙන් උගෙනීමටය. නාගරිකයන් අතරා වන් ඔහුගේ ආධ්‍යාත්මික පෞරුෂය සිඳී බිඳී වැගිරෙද්දී ඔහුට සිදුවන්නේ පියාපත් සිඳුනු පක්ෂියකුගේ වේගය ආරූඪ කර ගැනීමටය. සේන මහනුවර දී පෙරේරා මහත්මියගේ නවාතැනෙහි නේවාසිකයකු වීමට ඉටා ගන්නේ පාසැල හා ශිෂ්‍ය නිවාසයෙහි පිසෙන ආහාර ඔහුගේ දිව පිනවීමට සමත් නොවන හෙයිනි. නවාතැන හිමි පෙරේරා මහත්මිය දුටු මනතින් ම ඔහු සිත පිනා යන්නේ ඔහුගේ මවගේ රූපකායට ඇයගේ රුව මහත් සාදෘශ්‍යයක් දක්වන බැවිනි.



> "පෙරේරා මහත්මිය දැකීමෙන් සේනගේ සිත අමුතු ප්‍රීතියකින් බරවෙන්නට විය. ඔහුගේ මවට බොහෝ සමානකම් ඇති ඇය දකිත් ම සිත ආදරයකින් වෙළුණි. නළල, ඇස් දෙන, උස, මහත යනාදී සියලු ම අංග ඔහුගේ මවගේ මෙන්ය. තමමවගේ නියම හැඩරුව ඇති පෙරේරා නෝනා කෙරෙහි අමුතු ම ඇල්මක් සේනගේ හදවතට ඇතුළු විය."[22]

සිය මව කෙරෙහි ඇතැයි සේන වටහා ගෙන ඇති රුව ගුණ පෙරේරා මහත්විය වෙත ප්‍රක්ෂේපණය කිරීමට ඔහු යොමු වේ. නවාතැනෙහි දී ඔහු පෙරේරා මහත්මියගේ කනිටු දියණිය වන තෙරේසා සමග පෙමින් වෙළේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ගමෙහි සිටිය දී ඔහු සිතෙහි ප්‍රේමාශක්ත හැඟුම් ඇති කළ ගැමි ජීවිතයේ ප්‍රතිමූර්තියක් වන සඳවතී ද ඔහුට අමතක වෙයි. කර්තෘ තෙරේසා නම් නාගරික තරුණිය මවා ඇත්තේ නගරයේ ව්‍යාජ ජීවිතයේ සංකේතයක් පරිද්දෙනි. තෙරේසාගේ ප්‍රිය සමාගමය හේතුවෙන් ගැමි සිරිත් නිසරු යැයි සිතන සේන නාගරික ජීවිතයේ පත්ල නොදැක එහි බාහිර සාටෝපයේ ව්‍යාජ ජ්වලිතත්වයෙන් දැස් නීලංකාර කර ගනී. තෙරේසා ඔහුට දක්වූයේ මායාවී ප්‍රේමයක් බව වටහා ගත් ඔහු ඒ අවබෝධයෙන් දුර්මුඛ වී අධ්‍යාපනය ද කඩාකප්පල් කර ගනී.

> "අනේ මං වගේ කාලකන්නියෙක් මගේ හිත හදා ගන්න පුළුවන් කිසියම් දෙයක් මේ ලෝකෙ මට නැනෙ. මට උගන්වන්න ගිහින් අම්මලට තාත්තලට ගම අතාරින්න සිද්ධ වුණා. දැන් මං අතරමඟ මට ඉතින් සිත හදාගෙන ඉගෙන ගන්න පුළුවන් ද? මේක පාළු කාන්තාරයක්. අනේ මං මේ ලෝකෙට ඉපදෙන්නෙ නැතිව මැරිල ගියා නම් මීට වැඩියෙ කොච්චර හොඳ ද? බොරුකාර ගෑනු! තෙරේසා මං රැවට්ටුව. එයා මට ආදරය කළේ බොරුවට."[23]

මේ වන විට සේනගේ අධ්‍යාපනයට අවශ්‍ය මූල්‍යාධාර සඳහා සමන්තැන්න ගමේ ඔහුගේ පියපසට හා මව්පසට සතු සියලු ඉඩකඩම් විකිණී අවසානය. එහෙයින් අභිනවයෙන් බිහි වූ මිණිපේ ගොවි ජනපදයෙන් ගොවීන් අක්කර දෙකකුත්, මඩින් අක්කර තුනකුත් ලැබ සමන්තැන්න සදහට ම අතැර දමා මිණිපේ ගොවිජනපද යෝජනා ක්‍රමයේ මොරගස්ලන්ද කරා ඔව්හු සංක්‍රමණය වෙති. තෙරේසා හා ඇති

කරගත් පෙම් සබඳතාව දෙදරා යාමෙන් බලවත් මානසික ආතතියකට මුහුණ දෙන සේන නිවාසයෙන් පැන ගොස් තැන තැන සුළු රැකියාවල යෙදෙමින් යැපේ. එහි දී ඔහු මී විතට ගොදුරු වේ.

තෙරේසා මතක් වීමෙන් සිතට පාළුවක් හා පිළිකුලක් ඇතුල්වන අතර තම දෙමාපියන් සිහිවන විට බලවත් දුකකට ගොදුරු වෙයි. මෙයින් නිදහස් වීමට ඔහු නොගත් වෙහෙසක් නැත. මිතුරන් සමග එක් වී මත්පැන් බීමට ඇබ්බැහි වූයේ ඉන්පසුවය. නැවත ඔහු නවාතැනට ආපසු පැමිණෙන විට මුළු ගත ම මත්පැනට වහල් වී වෙහෙසට පත් ව අවසානය.[24]

අසීමාන්තික ව මත්පැන් පානය කිරීමේ හේතුවෙන් බරපතල රෝගාබාධයකට මුහුණ දෙන සේන සිය දෙමාපියන්ගේ අප්‍රතිහත ධෛර්යය හේතුවෙන් මනා වෙදකම් හා හෙදකම් ලැබ යළි සුවපත් වෙයි. පෙරළා ගමට පැමිණි ඔහු ගොවියකු වීමට ඉටා ගනී.

> ''මගේ තාත්තට කැත්තෙ උදැල්ලේ වැඩ පුළුවන්
> වුණා නම් මට බැරි මොක ද? ඔවු කියාපු රත්තරන්
> පොළොව ගොවිතැන් කරන්න මටත් බැරිකමක් නෑ..
> ඔව් මමත් ගොවිතැන් කරනව. උගන්වන්න මට බෑ.''[25]

සේන ගම කරා පුනරාගමනය කිරීම නවකථා කතුවරයාගේ ජීවන දර්ශනය ගමන් ගන්නා පථය විශද කරවන අවස්ථාවකි. කර්තෘගේ ආධ්‍යාශය වූයේ ස්වයංපෝෂිත කෘෂි අර්ථ රටාවෙන් විනිර්මුක්ත ව නාගරික වාණිජවාදී අර්ථ ක්‍රමය තුළින් අප සාක්ෂාත් කර ගැනීමට වෙර දරන පුරුෂාර්ථ දේශයටවත් එහි වාසීන්ටවත් කිසිදු යහපතක් සිදු නොකරන බව හැඟවීමටය. අක්කර පහේ සයවැනි මුද්‍රණයට සැබෑ වූ සිහිනයක් මැයින් ප්‍රස්තාවනාවක් සපයන මඩවල එස්. එත්නායක ජ්‍යොෂ්ඨය ඉංග්‍රීසි මාධ්‍යයෙන් සමත් සිය කථානායක තරුණයා ගමට ගෙන ගොස් කුඹුරට බැස්ස වූයේ මන්දැයි යන්න සාධාරණීකරණය කිරීමට ප්‍රකාශ කළ දැයින් පෙර දැක් වූ ඔහුගේ ස්ථාවරය පැහැදිලි වේ.

> "ඉංග්‍රීසි ජ්‍යොෂ්ඨ විභාගයෙන් සමත් වූවෙකුට ඒ දිනවල උපගුරු තනතුරක් ලබා ගැනීම ලෙහෙසි දෙයකි. එහෙත් මේ කතාවට ඇතුළත් කථානායකයා එය ප්‍රතික්ෂේප කොට කුඹුරට බැසීම කිසිවෙකුට ඇදහීමට බැරි කරුණක් වූවාට කිසි ම සැකයක් නැත. 'අර වගේ ඉගෙන ගත්තු කෙනෙකුට තමුසෙගෙ නවකථාවෙන් දීල තියෙන තැන හරි සවුත්තුයි නේද? අක්කර පහ පිට වූ දිනවල දී මගේ මිත්‍රයෙක් මගෙන් ප්‍රශ්න කළ සැටි දැනුත් මතක් වෙයි. මේ කතාවට පසුබිම් වී ඇති යුගය දෙස බලන විට කතාවේ අවසානය කෙසේවත් ඇදහීමට නොහැකි බව බොහෝ විට සිතෙන්නට පුළුවන. එසේ නම් මා එවැන්නක් ලීවේ ඇයි? පෑන අතට ගත්තවුන් පමණක් නොව, නගුල අතට පත්තවුන් ද, මේ සමාජයේ සමාන අයිතිවාසිකම් ඇත්තවුන් බව පෙන්වීමට මට වුවමනා කෙරිණි. කිසියම් අධ්‍යාපනයක් ලැබුවන් නගුල අතට ගන්නා තුරු නැත්නම් ගොවිතැන පහත් රක්ෂාවක් යන්න පොදු සමාජය තුළින් ඈත්වන තුරු රටේ සංවර්ධනයක් ඇති නොවේය යන්න මගේ හැඟීමයි."[26]



ගොවි ජීවිතයේ හරය දකින සේනට තිරසර වශයෙන් එහි නිමග්න වීමට පදනම වැටෙන්නේ පරමාදර්ශී ගැමි යුවතිය ලෙසින් රූපණය ව ඇති සඳවතී හා සරණ බන්ධනයට පිවිසීමෙන් අනතුරුවය. සේනගේ නාගරික පෙම්වතිය වන තෙරේසා කර්තෘ විසින් නිරූපණය කර ඇත්තේ සම්මතය නිශ්චිතය වන කුටිල නාගරික මෝස්තරකාරී තරුණියගේ ඒකාකෘතිය ලෙසිනි. (Stereotype) සඳවතී ඊට පරස්පර ව ගමට, ගැමියනට හිමි සකල විධ යහපත් දෑ පුද්ගල රූපකායට නංවා සැලමුතු පෙමෙහි සුචරිතයෙහි හා විනීතත්වයෙහි දෘෂ්ටාන්ත රූපයක් (Allegory) ලෙස උත්කර්ෂයට නංවා අප හමුවට පමුණුවයි. සමකාලීන භාරතීය සිනමාවෙහි ද ගමින් නගරයට වන් තරුණයන් හසු වූයේ චපල නාගරික පෙම්වතියන්ගේ පාශයටය. හුදු ඉන්ද්‍රිය ප්‍රීණනය ම මහත් කොට තැකූ බටහිරකරණය වූ නාගරික විලාසිනියෝ ප්‍රේමයෝ ව්‍යාජයක් ගැමි තරුණයන් හමුවේ මවා පා ඔවුහු තාවකාලික ව මුලාවේ ලෑහ. එහෙත් ජීවිතය තිබුණේ ගමෙහිය. එය සුපුෂ්පිත කරවන සැබෑ ප්‍රේමය තිබුණේ දුරු රට ගිය ප්‍රියයා පෙරළා පැමිණෙන තෙක් ඉවසීමෙන් මඟ බලා සිටි ගැමි මනාලියගේ දෝතෙහිය. **දෝ රාස්තේ, පූරබ් ඖර් පශ්චිම් හා උපකාර්** යන සිනමා කෘති මේ 'සත්‍යය' පුනරුච්චාරණය කරමින් නිර්මිතය.[27] සාහිත්‍ය කලාවන්ගෙන් කථ්‍ය සාමාජයීය තොරතුරු මෙන් ම තත් සමාජයේ හරයන්ගේ හෙවත් අගයන්ගේ මෙන් ම හැඟීම්වල ව්‍යුහයේ

පිළිබිඹුවක් ද (Structure of feelings) අන්තර්ගත විය හැකිය. බටහිරකරණය වූ දුදන, චපල නාගරික තරුණිය හා කුලදම් පණනල සේ රකින අවිහිංසක අචපල, සුදන ගැමි තරුණිය යන ඒකාකෘති (Stereotype)අච්චුවල බහා මඩවල එස්. රත්නායක තෙරේසා හා සඳවතී මවා ඇත්තේ දේශජ පොදු ජනයාගේ හැඟීම්වල ආකෘතියෙන් නො එසේ නම් චින්තන වින්දන රටාවන්ගෙන් ලද ප්‍රේරණය හේතුවෙන් විය හැකිය.

අක්කර පහ සමකාලීන පාඨකයාගේ නොමඳ ආස්වාදයට බඳුන් වූයේත් සුහද පිළිගැනීමකට පාත්‍ර වූයේත් විශේෂයෙන් මේ කාන්තා චරිත ඔවුනට විශ්වසනීය වූ ඒකාකෘති ලෙස රූපණය වී තිබීම නිසා යැයි තර්ක කළ හැකිය. වෙනත් අයුරකින් පවසතහොත් එම කාන්තා භූමිකා නියෝජනය කළ සමාජ මානසික තල පාඨකයන්ට ආගන්තුක හෝ දුරස්ථ ඉසව්වක නොතිබිණි. සාහිත්‍ය සමාජ විද්‍යාත්මක දෘෂ්ටියකින් අක්කර පහ නවකථාව විශ්ලේෂණයේ දී පාඨක සමාජය ඒ කෘතිය කෙරෙහි දක්වන ප්‍රතිචාරය යන විෂය ප්‍රදේශය ගවේෂණයේ දී පූර්වෝක්ත කරුණ වැදගත් වේ.

සාහිත්‍ය කෘතියක් ස්වාධීන ව ප්‍රාදූර්භූත නොවේ. එය පහළ වන්නේ එය අයත් යුගයේ හා සමාජයේ ඓතිහාසික සංස්කෘතික ආදී බලවේගයෙන් පසුබිම් කරගෙනය. සැබැවින් ම දේශීය කෘෂි ජන ජීවිතයේ නවෝදයක් උදා වී තිබුණු සමයක කතුවරයාගේ උපකල්පනයට හා සිතැඟියට අනුරූප ව අක්කර පහ නවකථාවෙහි කතුවරයා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ජ්‍යෙෂ්ඨය සමත් තරුණයකු නගරයෙන් ගමට ගෙන්වා ඔහු කුඹුරට බස්සවා ඇත. කලාව යනු සත්‍යය හා ව්‍යාජය අතර දෝලනය වන්නක් බැවින් මඩවලගේ ඒ ප්‍රයාසය දෝෂ දර්ශනයට පාත්‍ර විය යුත්තක් නොවේ.

1970 න් ඇරඹෙන දශකයෙහි රචිත ප්‍රධාන ධාරාවේ නවකතා ප්‍රස්තුතික හා දෘෂ්ටිමය පාර්ශ්වයෙන් පූර්වෝක්ත අක්කර පහ කෘතිය හා සාම්‍යත්වයක් දරන නිරීක්ෂණයක් කළ හැකිය. දීර්ඝ කාලීනව බ්‍රිතාන්‍ය යටත් විජිතයක් වශයෙන් පැවතී තදනන්තරව දිනාගත් නිදහසින් නො එසේ නම් ස්වෛරී රාජ්‍ය සංකල්පයෙන් ඔද ගැන්වී පාරම්පරික සම්මා ආජීවය වූ කෘශක ජීවනය උත්කර්ෂයෙන් හුවා



දැක්වීම තත් කර්තෘගේ අභිලාෂය විය. එතෙකුදු 1970 න් ඇරඹෙන දශකයට අයත් නවකතා සමුච්ඡය විසින් නියෝජනය කෙරෙන ප්‍රවණතාවට තෝතැන්නක් වූයේ 1970 වර්ෂයෙහි සමගි පෙරමුණු රජය රාජ්‍ය බලය සියතට ගැනීමේ සංසිද්ධිය එහි දී ආකල්පයෙන් ධනේෂ්වර වූ දේශපාලන පත්ෂයක් හා අන්‍යතර වාමාංෂික පක්ෂ අතර සම්මුතියක් ඉදිව සභාග ආණ්ඩුවක් බිහි කර ගැනීමට කටයුතු සම්පාදනය කෙරිණි. සන්ධානයෙහි වාමාංශික දේශපාලන පක්ෂ නියෝජනය කළ ඇතැමුන්ට අමාත්‍ය පදවි ලබා ගැනීමේ අවස්ථාව ද උදා විය. මෙම වාමාංශික දේශපාලඥයන්ට හිතෛෂි වූ ඇතැම් සාහිත්‍යධරයෝ තම නිර්මාණ මාධ්‍යය කැප කළෝ නිර්ධන පංතියේ නො එසේ නම් දුක් විඳිනා ජනයාගේ ශෝකාලාපය නිරූපණය කිරීමටය.

1970-77 අවධියෙහි දේශපාලන බලය ඉසිලූ රජය විසින් දියත් කරන ලද වගා සංග්‍රාම 1972 හා 1975 ඉඩම් ප්‍රතිසංස්කරණ වැනි සාපේක්ෂක වශයෙන් ප්‍රගතිශීලී ජනතාවාදී ව්‍යාපාරයන්හි ඡායාව එවක සාහිත්‍යයට විශේෂයෙන් නවකථා මාධ්‍යයට පතනය ව පවතී. යථෝක්ත ප්‍රතිසංස්කරණයන්ගෙන් කෘෂි අංශයේ දියුණුවට අවැසි අයුරින් මිළ ප්‍රතිපත්ති අලෙවි ප්‍රතිපත්ති, කෘෂි ව්‍යාප්ති සේවාවන් ආදිය ක්‍රියාත්මක වූ අතර ඉඩම් ප්‍රතිසංස්කරණ මගින් ඉඩම් අයිතිය සහ භුක්තිය සම්බන්ධයෙන් පවත්නා තත්ත්වය වෙනස් කිරීම ඉඩම් බදු ක්‍රම සංශෝධනය වීම, ඉඩම් ඒකාබද්ධ කිරීම වැනි ක්‍රියාමාර්ග දියත් කරනු ලැබීය.[28] මෙකී ජනතාවාදී දේශපාලන දර්ශනය හා මානව ශ්‍රමයේ අගය උත්කර්ෂණයට නැඟීමේ පරමාර්ථයෙන් රචිත නවකථා වශයෙන් ජයසේන ජයකොඩිගේ **අස්වැන්න**, ඒ. වී. සුරවීරගේ **හෙයියම්මාරුව** හා **නොයන් පුතුනි ගම හැරදා**, ඇරැව්වල නන්දිමිත්‍රගේ **මිහිසරණ** හා මඩවල එස්. රත්නායකගේ **නිල්මල්විල** නිදර්ශනය කළ හැකිය.

## අස්වැන්න

ජයසේන ජයකොඩිගේ අස්වැන්න නවකථාවට තේමාව වන්නේ එක්දහස් අටසිය ගණන්වල සමාරම්භක අවධියේ දී ඝෝර වනය විසින් ගිලගන්නා ලදුව, ජනශූන්‍ය ව පැවති රයිගම් කෝරළය බුංජප්පු නම් කථානායක ගොවියාගේ පුරෝගාමිත්වය හා මාර්ගෝපදේශකත්වය මත ජනාවාස වී සෞභාග්‍ය සම්පන්න

බිම්කඩක් බවට පත්වීමේ පුවතයි. ධෛර්ය සම්පන්න, කාර්යශූර උද්‍යෝගී කෘෂකයාට පොළොව මගින් සැපයෙන්නේ ආශිර්වාදයක් ම බව කථානායක භූමිකාව වන බුංජප්පුගේ චරිතය හා සබැඳි හා සිද්ධි නිරූපණයන්ගෙන් අවධාරණය කිරීමට කර්තෘ උත්සාහ ගනී.

> "බුංජප්පුගේ ඇල් වී වගාව රන්වන් කරලින් බර වී තිබිණ. මහ දවල් ගොනුවක් නැති ව හැමූ සුළඟින් රන්වන් කරල් වලාවෙන් වලාව සිලි සිලියේ සෙළැවී ගියේය. වට්ටක්කා, කැකිරි හා කොමඩු වැල්වල ගෙඩි පිරී තිබිණි. අමුත්තා පැමිණියේ බංජප්පු මේ සරුසාර අස්වැන්න දෙස බලා ඉතා සතුටින් සිටින අවස්ථාවකය. බොහොම හොඳවී. බොහොම හොඳයි. මට පේනව උන්නැහේ බොහොම ආඩම්බරේට ඉන්න බව. ගොවියෙකුට තියෙන ආඩම්බරය ඕක තමයි. තමන් වෙර මහන්සියෙන් ගොවිතැන් කරපුවාගේ පොරතිපල පේන කොට ඒක තමයි ගොවියෙකුගේ තන්තෝසය.."[29]

ගොවියා ඔහුගේ භූමිය හා ශෂ්‍ය ඵලදාව යන ත්‍රිත්වය අතර ඇති සමවාය බැඳීම උත්කර්ෂයෙන් යුතු ව නිරූපණය කිරීමට ද ජයසේන ජයකොඩි මෙහෙය වී ඇත්තේ තමා නවකථාවෙන් ප්‍රකට කිරීමට තැත් කරන වචන්නෝ දිනන්නෝය යන දර්ශනය තීව්‍ර කරන අන්දමිනි.

> "... මං ගියා බෙරකැටියෙ මගෙ මහ කුඹුරට. අනේ බොලව් වෙලට ගියා. ම කුකුල් පැටව් වගෙ ගොයම් පැළ මං වටේ රොක් වෙන්න ගත්තා."
> ''උන්ට කතා කරන්න බැරිව විතරයි. අවුරුදු ගාණක් තිස්සෙ උන් මාව අඳුරනවා. මම උන්ට කන්න බොන්න දීලා තියෙනවා. මං හොඳින් කන් දී ගෙන සිටිය. මට ඒ පුංචි පැටව් මොනව හරි කියයි කියල.''[30]

## හෙයියම්මාරුව

ඒ. වී. සුරවීරගේ හෙයියම්මාරුව නවකථාවේ කථානායකයා වන ගුණපාල ගැමි දිළිඳු පවුලක ඉපිද අධිපතිවාදී ගම් දෙටුවන්ගේ හා දේශපාලනඥයන්ගේ දහසක් බාධා කිරීම් මධ්‍යයේ මහත් ධෛර්යයෙන් ඉගෙන කෙළවර ඉංග්‍රීසි ගුරු පත්වීමක් ලබා ගැනුමට සමත් වෙයි. පෙරළා ඔහු සිය මෙහෙවර ඉටු කිරීමට තම ජාත ග්‍රාමය වූ හෙයියම්මාරුවට පැමිණේ. දූෂිත ධනකාමී පුද්ගලයන්ගෙන්



තම ගම රැක ගැනීමට සිහින මවන ගුණපාලට ගමේ පන්සලේ තරුණ ස්වාමීන් වහන්සේ ආධාර අනුශාසනා ලබා දෙති. ගමෙහි ප්‍රගතිශීලී තරුණයන් එක්රැස් කරන ගුණපාල 'ප්‍රබුද්ධ' නමින් තරුණ සංවිධානයක් පිහිටුවා ගනියි. දැන් සෞභාග්‍යයෙන් හීන ව සිටින අතීතයෙහි ග්‍රාමීය අධිපතීත්වය හිමි වූ ගමේ වලව්වේ එතන හාමිනේ නම් ප්‍රභූවරිය ස්වකීය රදල පවුලේ පාරම්පරික උරුමය වූ වලව්වත්ත සමූහ ගොවිපළක් ඉදිකිරීම සඳහා පරිත්‍යාග කරන්නීය. ගොවිපළෙහි අස්වැන්න සශ්‍රීක වූයෙන් නැවතත් ගමට ඉසුරුබර කාලයක් උදාවේ.

> "ඊළඟ පෝය දා කැලෑ එළි කිරීම ආරම්භ විය. කැති පිහියා ගත් සමහරු පඳුරු හා මල්ගස් කපා බිමට පාත් කළහ. සමහරු උදලු ගෙන පඳුරු හුඹස් ආදිය කොට දැමූහ. සුමේධ හාමුදුරුවෝ වැඩ අරඹද්දී සෙත් පිරිත් කීවෝය. අවුරුදු ගණන් තිස්සේ පාළුවට ඇරී තිබුණු වලව්වත්තේ එදා ඔහු කලබල ගතියක් පෙනිණි."[31]

> "ගොවිළ සරුසාර වෙත් ම මුල දී ව්‍යාපාරයට හවුල් නොවූ කැබලිකරුවෝ ද කැමැත්තෙන් ම ඉදිරිපත් වූහ. තුන් හාර මසක් ගත වූ තැන මුළු ඉඩම පෙර නුවූ විරූ සශ්‍රීකත්වයකින් වැජඹෙන්නට වූයේය."[32]

> "වලව්වත්තේ ඉතිරි කොට ද ගොවිතැන් කිරිම සඳහා ඉඩ හැරිමට එතන හාමිනේ කැමති වූවාය. දැන් මුළු වලව්වත්තේ අක්කර පණස්පහ එක ම මහා ගොවිපළකි. වලු බර පොල්ගස් යට පේළියට පෙනෙන අන්නාසි, මඤ්ඤොක්කා පඳුරු, බුලත් පාත්ති, මිරිස්, බටු, බණ්ඩක්කා, වට්ටක්කා.. හරි පුදුමයි"[33]

> "අනේ වාසනාවන්, පොඩි සුවාමින් වහන්සේටය් පාල ළමයටය් පිං සිද්ධ වෙච්චාවෙ. ඉතින් හෙයියම්මාරුවෙ කොයි කවුරුත් අතටත් සල්ලිය බාගෙ හිඟයක් වෙන්නෙ නෑ. මෙදා පාරේ සිංහල අවුරුද්ද ජයට ම කෑ හැකි.."[34]

## නිල්මල්විල

මඩවල එස් රත්නායකගේ **නිල්මල්විල** (1989) ලියැවුණු කාලය අනුව බැලූ කල 70 දශකයේ නවකථාවලියට අයත් කළ නොහෙන නමුදු ජීවන දෘෂ්ටිය විසින් නම් රත්නායක ද සිටින්නේ සුරවීර සිටින තැනමය. සාම්ප්‍රදායික ඉඩම් හිමියකු වූ ද කෘෂිකර්මයෙන් ජීවනය සාදා ගන්නා ගම් දෙටු රදල ප්‍රභූවරයකු වූ ද

ගම්මුලාදෑණියෙකුගේ එක ම පුත්‍රයා වන අබේරත්න විශ්වවිද්‍යාලයීය උපාධියක් ලැබ ආණ්ඩුවේ රක්ෂාවක් කරනු පිණිස කොළඹ බලා යයි. එම රැකියාවෙන් කිසිදු ආත්ම තෘප්තියක් නොලද ඔහු යළිත් ගම කරා ආගමනය වන්නේ ගොවිතැන් බතක නිරත වීමේ සිතැතිවය. එහෙත් ඔහුගේ පියා පුතාගේ ආගමනය පිළිගන්නේ එතරම් ප්‍රසදවාහී චින්තනයකින් නොවේ.

> ''නිකං උඹ කල්පනා කරල බලපන්ඃ මේ පළාතට ම බී. ඒ. කාරයෙක් ඉන්නේ උඹ විතරයි. ඒක මොනතරම් නම්බුවක් ද? අපේ හත්මුතු පරම්පරාවට ම නම්බුවක්. කොර කොර හිටපු රස්සාව අතෑරල ගෙදරට වෙලා ඉන්න ලැජ්ජා නැද්ද? ගම්මුලාදෑණිකම මං කෙරුවෙ තඹ දොයිතුවක්වත් වාසියට නොවෙයි. මං ඒ රස්සාව කොරපු හින්දා තමයි, මට අදත් මේ පළාතේ උදවිය සලකන්නේ...''[35]

සමාජයේ ගෞරවය තවමත් කේන්ද්‍රගත ව පවතින්නේ විශේෂ වෘත්තික ශ්‍රේණි වටා විනා ගොවිකම්හි නියුතු ජනයා වෙත නොවන බව මේ උද්ධෘතයෙන් පැහැදිලි වේ. **අක්කර පහ** ලියැවුණු වකවානුවේ සිට (1959) **නිල්මල්විල** රචිත අවධිය වන තෙක් (1989) දශක ගණනාවක් ගෙවී ඇතත් ගොවිකම පිළිබඳ මෙරට ජනයාගේ පොදු ආකල්පයෙහි වෙනසක් සිදු වී නොමැති සේය. තමා රැකියාවෙන් අස්වූයේ මන්දැයි යන්න සාධාරණී කරණය කරමින් කථානායකයා තම පෙම්වතිය මෙන් ම ඇවැස්ස නෑනණ්ඩිය ද වන දිසා නංගී වෙත දීර්ඝ ලිපියන් ලියා ගොවිකමේ අනුසස් එහි දී වර්ණනාවට ලක් කරයි.[36] ඒ කතුවරයාගේ ජීවන දර්ශනය විදහා දක්වන තැනකි.

අබේරත්නගේ මාර්ගෝපදේශකත්වය යටතේ ආරම්භ කිරීමට නියමිත සමූහ ගොවිපළට ගමේ පන්සලේ හාමුදුරුවෝ ද ඉත සිතින් ආශිර්වාද කරති. එය ගොවිකම සම්මා ආජීවයක් ය යන දේශීය ජන විඥානගත ආකල්පය විශද කරන තැනකි.

> ''මහත්තය මේ කරන්ඩ යන්නේ පිංසිද්ධ වෙන වැඩක්. සණ්ටාර කුළුණක් හදල පූජා කෙරුවට වැඩියෙන් ලොකු දෙයක්. මේ ගමේ උදවිය වැඩියෙන් ඉහිරිලා ඉන්නෙ. එකමුතුවක් නෑ...''[37]



සමූහ ගොවිපළ නිර්මාණය කිරීම සඳහා, කාය බලයෙන් අනූන ගමේ කරුණු මැර කල්ලිය නියෝජනය කරන දනියා, සනියා වැන්නවුන්ගේ මෙන් ම සාම්ප්‍රදායික ඥානයෙන් අනූන මානෙල්හාමි උන්දෑ හා බන්දුල අත්තා යන පරම්පරා ද්වයේ ම සහයෝගය ලැබේ.[38]

ගොවිපළ සඳහා අවශ්‍ය මූල්‍යාධාර බැංකුව මගින් ද නෛතික සහතිකය පළාතේ කච්චේරියෙන් ද කෘෂිකාර්මික උපදෙස් ප්‍රදේශයේ වගා කටයුතු භාර නිලධරයන්ගෙන් ද වහ වහා සම්පාදනය වීමෙන් අබේරත්නගේ සමූහ ගොවිපළ සිහිනය යථාර්ථයක් වෙයි.

> "අත්ගොබ මෙන් සරුවට වැඩෙන පිපිඤ්ඤා දළු බටු ගස් දකින අබේරත්නට විශාල සතුටක් ඇතිවෙයි"[39]

සමූහ ගොවිපළව අනුබද්ධ ව තලකොළ කර්මාන්ත අංශයක් ද, වී වගාවක් ද ඇති කෙරෙන අතර ගමට නව එළියක් ලැබෙන්නේ සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ආධාර ඇති ව පිහිටුවා ගත් පුස්තකාලයක් ක්‍රීඩා අමාත්‍යාංශයේ ආධාර ඇති ව පිහිටුවා ගත් වොලිබෝල් පිටියත් හේතුවෙනි.[40]

හෙයියම්මාරුව හා නිල්මල්විල නවකථාවේ වියමන (Motif) ඒක රූපීය. රජයේ රැකියාවක නියුතු ඉංග්‍රීසි උගත් තරුණයා ඔහු ගම කරා පුනරාගමනය සමූහ ගොවිපළ ඉදිකිරීමෙන් එහෙත්කඩ කඩ ව පැවති ගැමි සමාජය එකට එක්කොට සාමූහිකත්වය හා සහජීවනය යන හුයින් බැඳ තැබීම, සමස්ත ක්‍රියාදාමයට ස්වකීය ආශිර්වාදය ඉත සිතින් ගෙන එන පන්සලේ ස්වාමීන් වහන්සේ යනුවෙනි. කර්තෘවරු දෙපළ ම හෙළි කරන්නට උත්සාහ ගන්නා ජීවන දර්ශනයේ ද පවතින්නේ ඒකමිතියකි. ජනතාවාදී සාහිත්‍ය දර්ශනය ඔවුනගේ සාහිත්‍යකරණය වෙත බලපා ඇත්තෙන් මේ සාම්‍යය නිර්මාණය වී ඇත.

## නොයන් පුතුනි ගම හැර දා

ඒ. වී. සුරවීරගේ **නොයන් පුතුනි ගම හැර දා** (1975) නවකථාවෙහි දී මුඛ්‍ය චරිතයක් වන ගමේ ඔපිසර මහතාගේ බාල පුතණුවන් වන විමලදාස ජ්‍යොෂ්ඨය දක්වා උගත් අයෙකි. රජයේ රැකියාවක් පතමින් සිටින හෙතෙම කලාවැව ගොඩ ජනපදයේ

වෙසෙන තම මාමණ්ඩිය බැහැදකීමට යයි. ඔවුන්ගේ සෞභාග්‍ය සම්පන්න කෘෂක ජීවිතයෙන් ගාමක ජලය ලබන ඔහු පෙරළා ගම කරාගොස් පිය උරුමයෙන් තමාට උරුම වූ මේ වන විට පාළු වී ගොස් ඇති ඉඩම් යළි වගා කළ යුතු බවට අදිටන් කර ගනී.

"අවුරුදු හත අටකට උඩ දී රජයේ ඉඩම් ලැබ ගම අතැර ගිය මාමලා ගැන අම්මත් අක්කත් ගමේ වෙනත් අයත් කතා කළේ හරියට සාගින්නේ වියළෙමින් දහදුක් විඳින අසරණ පිරිසක් සැටියටය. දැන් බලන විට ඇත්ත වශයෙන් ම මාමලා ගත කරන ජීවිතයට එයට වඩා බෙහෙවින් සැපවත් එකක් බව පෙනේ. කලාවැවට හා නොහැකි නම් අඩු ගණනේ ගමේදීවත් ගොවිතැන් කටයුතුවල යෙදීමට ඔහු ඉටා ගත්තේය."[41]

ගොවිතැන් කටයුතු සාර්ථකත්වයට පත්වන පෙරනිමිති පහළ වූයෙන් ඔහු රජයේ රැකියා සිහිනයට ද විරාමයක් තබා එබඳු වෘත්තිකයන් වෙත අවඥා පරවශ බැල්මක් ද හෙළීමට නොපසුබට වේ.

"මට නං රස්සාවල් හොයන්ඩ කවුරුත් උවමනා නෑ. මට රස්සාවක් තියෙනවා. වෙන ඒවා නැතුවාට ඔබ දැන් ගොවිතැන් කරනවා. ඒ රාජකාරි මට හොඳටම ඇති. මට ඕන්නැති රස්සාවක් නැහැ එකෙකාගේ ගොම්පස් අල්ලන්ඩ.."[42]

විමලදාස ගොවිකමට පිවිසෙන්නේ අලුත් තාක්ෂණික ක්‍රමවේද, අලුත් බෝග වර්ග, අලුත් පොහොර වර්ග පිළිබඳ නවීනතම දැනුමින් සන්නද්ධවය. 1960 දශකයේ අගභාගයේ මෙරට ඇති වූ හරිත විප්ලවයේ ඡායාව හා 70 දශකයේ සමගි පෙරමුණු ආණ්ඩුව විසින් කරළියට ගෙන ආ කෘෂිකාර්මික ප්‍රතිසංස්කරණවල ආනුභාවය මේ සන්නද්ධ වීම කෙරෙහි බලපා ඇත.[43]

"පළමු වතාවට එහි බිත් නැගුම පාන ලද්දේ ට්‍රැක්ටරයකිනි. වෙනදා තනි මී ගොන් බානක් බැඳගෙන වරු ගණනක් සානු ලබන මහ කුඹුර වක වරුවෙන් හා අවසන් කෙරිණි. ... ඔය දෙබල් කොට ගහගෙන පුළුවනෑ මඩ වැඩ... මී ගොං බානත් කකුල් ගහලා යනවා වාගෙ කොහෙද ආයෙ.. පරණ ගොවියෝ පුරසාරම් දෙඩුවෝය. එහෙත් වෙනදා මඩ වතුරට යට වී නඟුලට අසු නොවන



ඇතැම් කොටස්.. වෙදාට වඩා හොඳින් මඩ වී යන හැටි දකින විමලදාස පසුබට නුවුනේය... පේන තෙක් මානයේ නිලට නිලේ සරුවට වැඩෙන ගොයම් පාල දිනෙන් දින බලා සිටිය දී උස් වී කරල් බේරී කිරී වැදී මෝරා යමින් රන්වන් පැහැයට හැරෙත් ම විමලදාසගේ ප්‍රීතිය ද ඒ සමග මෝරයි. දෙතුන් මසකට වරක් කෘෂිකර්ම ව්‍යාප්ති කාර්යාලයට ගොස් ඒ නිලධාරීන් හමු වී සාකච්ඡා කිරීමට විමලදාස අමතක නොකළේය... ඔහුගේ වගාවලින් වඩා හොඳ ප්‍රතිඵල ලැබෙන සැටි ඇස් ඉදිරියේ පෙනෙන්ට වූ පසුය අනෙක් ගොවීන් ද ටිකින් ටික ඒ ක්‍රම භාවිතයට පටන් ගත්තේ...."[44]

විමලදාසගේ බෑණණුවන් වන සනත් දක්ෂ ලෙස අධ්‍යාපනය හැදෑරූ රුමේනියාවේ ශිෂ්‍යත්වයක් ද ලැබ රජයේ ඉහළ තනතුරකට උසස් ව ගම බලා එන්නේ ගම වැස්සන්ට සේවය කිරීමේ පරමාර්ථයෙනි. කෙසේ වෙතත් ගමේ සාම්ප්‍රදායික දේශපාලන බලවත්තු හා කුලදෙටුවෝ ඔහුට ඉදිරියට ඒමට මඟ අවුරා සිටිති. තමා ගමට හා ගැමියනට මහත් සේවයක් ඉටුකළ යුතු යැයි අදහන සනත්, කොපමණ බාධක තමා වටළා ගත්ත ද, කොපමණ වෛරීන් තමා හෙළා තළා දෝෂ දර්ශනය තුළ ද ගමෙහි ම රැඳී සිට රක්ෂාව පිණිස පමණක් නගරයට යන්නෙමැයි ඉටා ගනී. මේ නිශ්චයට පැමිණෙන්නට ඔහුගේ සිත සකස් කරන්නී වයෝවෘද්ධ ආත්තම්මා හෙවත් ඔපිසර හාමිනේය.

"හා පුතේ මේම් මේක අහගනිල්ලා. මගේ මේ කෙස් පැහැලා කුදු ගැහෙන්න කලියෙං රටේ ලෝකෙ සිද්ද වෙච්ච දේවල් අහලා දැකලා තියෙනවා. ඔය රස්සාවල් කෙරෙනවා කියලා මාසෙ අන්තිමට පිටිං පඩි ගන්න මිනිස්සු කුසීත වෙලා කැත්ත, උදැල්ල අල්ලන්ට ලැජ්ජාවෙ ගමරට දාලා සිදාදියට ගියා. හැබැයි ගිය උන්ට අල්ලපු අත්තත් නෑ. පය ගහපු අත්තත් නෑ. පහුණු යුද්දෙ කාලෙ උඹල දන්නෙ නෑ. හොඳ ලොකු ලොකු මහත්තුරු ඉනේ පළඳින තොප්පිය දික් කොරගෙන ආවා. ළමයි හාමතේ. කීයකට හරි හාල් සේරුවක් දෙන්ට කියල ඉල්ලාගෙන. දාහතරෙ යුද්දෙදිත් එහෙමයි. රාළහාමියි මායි හොඳට කන්ට දීලා හාලුත් දීලා ඇරියා. පිනට. මොකටද මං කියන්නේ කැලේ සතාට කැලේ කිව්ව වාගේ ගමේ උපන් එකාට ගම ඇරලා ගිහුං බෑ පුතාට ඔය රට රාජ්ජේ ගිහුං

> ආවත් කැත්තෙ උදැල්ලේ වැඩ පුළුවනි නේ. ඉතින් මොකෑ බය වෙන්නේ."[45]

සුරවීරගේ හෙයියම්මාරුවේ කථානායකයා වන ගුණපාලත් මෙහි දී හමුවන සනත් නම් තරුණයාත් එක ම වර්ගයේ චරිත බවට සැකයක් නැත. එක සමාන චරිත හමුවීම තුළින් සමර්ථනය වන්නේ තත්කාලීන ආර්ථික දේශපාලන සාධකත් විදග්ධ සමාජයීය සංවාදයත් අදාළ යුගයේ සාහිත්‍ය කලා විෂයෙහි ආනුභාව දක්වන බවයි.

## මිහිසරණ

ඇරැව්වල නන්දිමිත්‍රගේ මිහිසරණ (1984) කෘතියට පසුබිම් වී ඇත්තේ වලවේ හා නිම්නයේ වන මැද පිහිටි ගමකි. මෙහි ලා කර්තෘ චිත්‍රණය කරන්නට පෙලඹී ඇත්තේ රයිගම් කෝරළයේ දියුණු ගම් පියසක පිට වන මැද පිහිටි ගම්මානයකට සංක්‍රමණය වූ අනාථ සොයුරියට හා සොයුරෙකු (මිසිලින් හා සෝමපාල) පරිසරය සමග පොරබදිමින් ජවිතාභියෝගයන්ට මුහුණ දෙන ආකාරයයි. අනේක විධ පීඩාවන්ගෙන් බැට කල නමුදු ඔවුහු ඇද නොවැටහෙන්නෝ, ඝන වන ප්‍රවාහයට තමා යටපත් කර ගෙන යන්නට ද ඉඩ නොසලසති. මිහිසරණෙහි එන ප්‍රධාන කථානායක භූමිකාවක් වන පෙර කී සෝමපාල නම් තරුණයා ජීවිකාව සපයා ගනුයේ එඬේර වෘත්තියෙනි. රජය විසින් හුලංදා ඔය හරස් කර හල්මිල්ලකැටිය ගම් ප්‍රදේශයේ චන්ද්‍රිකා වැව නමින් ජලාශයක් ඉදිකර වලවේ නදියේ මොගොඩ ඉවුරේ අභිනව ගොවි ජනපදයක් ඉදි කරයි. සෝමපාල එඬේර වෘත්තිය බැහැර ලා ජානපදිකයෙකු වී ගොවිතැනින් ජීවිතය ජය ගැනීමට ඉටා ගනී.

> "...පටන් ගන්න යන කොලනියෙන් දැන් ඉතින් මමත් කොහොම හරි ඉඩම් කෑල්ලක් ඉල්ල ගන්න බලන්න ඕනෑ. වෙහෙස මහන්සි වෙලා ගොවිතැනක් බතක් කරගෙන ජීවත්වෙන්න බලාපොරොත්තු වන මිනිහෙකුට මහ පොළොව තරම් පිහිට වන තවත් දෙයක් නැතැයි කියල මට හිතෙනවා..."[46]

නවකථාව අවසාන වන්නේ සොබාදහම සමග අරගල කොට එය ජයගැනීමට මිනිසා සතු ව ඇති කායික හා මානසික ශක්‍යතාව උත්කර්ෂයෙන් යුතු ව අවධාරණය කරමිනි.



> "ඇෑ මලය. මේ ගොඩ ඉඩමට ලැබිල තියෙන හරිය නම් මහ ම මූකලාන. කුඹුරු ඉඩම් ලැබිල තියෙන හරියත් මේ වගේ ම මූකලාන ද?.. එහෙම නම් මලය මේව එළි පෙහෙළි කොරල අස්වද්දල ගන්න මොන අප්පෙකුට පුළුවන් ද? ජුවන් මවිතයට පත් වූ කලෙක මෙන් දෙතොල් සෙලවීය. මනුස්ස ජීවිතෙට ආදරයක් කියල දෙයක් තියෙනවා නම් කරන්න බැරි දෙයක් නැහැ මස්සිනෙ. මගේ අතපය හොඳට හයියයි. ඒ හින්දා මූකලානත් එක්කල පොර බදලා මේ ලැබිච්ච ඉඩම්වල නැවුම් පස පෙරළ ගන්න අපිට පුළුවන් වෙයි. අපරාජිත හඬකින් පැවසූ සෝමපාල...''[47]

හැත්තෑව දශකය වන විට මෙරට ආර්ථිකයේ උද්ගත වූ අර්බුදය 1970 සමගි පෙරමුණු රජය නියෝජනය කළ වාමාංශික ධාරාව හා එම රජයේ ප්‍රගතිශීලී සමාජ ආර්ථික ප්‍රතිපත්ති මෙන් ම සාහිත්‍ය කලා පාදක කර ගනිමින් සමාජයේ ගොඩනැගී විදග්ධ සංවාදයේ පෙරටුගාමී බලවේගය වූ සන්ධාන රජයට හිතෛෂි සමාජ සත්තා යථාර්ථවාදී විචාර න්‍යායේ ප්‍රචාරකයක් වූ බුද්ධි ශ්‍රේණිය යන මේ දෑ එවකට සාහිත්‍ය කලාවන්හි වස්තු විෂය හා දෘෂ්ටිය නිශ්චය කිරීමට ගාමක බලවේග ලෙස ක්‍රියාත්මක වූ බව පැහැදිලිය.

## සමාලෝචනය

අප විසින් ඉහතින් සාකච්ඡා කිරීමට යෙදුණු නවකථාවලිය (විශේෂයෙන් එක්දහස් නවසිය හැත්තෑවෙන් ඇරඹෙන දශකයෙහි රචිත අස්වැන්න, හෙයියම්මාරුව ප්‍රමුඛ කරගත් කෘති සමූහය) තුළ අන්තර්ගත වූ ජනතාවාදී ආකල්පය තත්කාලීන පාඨකයන් විසින් සුහදත්වයෙන් යුතු ව පිළිගැනුණේ කවර හෙයින්දැයි අනුමාන කිරීමට බලපෑ ඓතිහාසික සංසිද්ධියක් ඇත්තේය. 1971 දී ඇති වූ තරුණ කැරැල්ල කෙටි කාල ඡේදයකින් අනතුරු ව පරාජයට පත් වූයේ වී නමුදු, එය විසින් පොදු ජන විඥානය වෙත මුදා හරිනු ලැබුවා වූ 'සමාජවාදී මනෝ රාජ්‍ය සුපිනය, කලක් ගත වන තුරු ම තුරන් ව නොගියේය. අපගේ අදහස වන්නේ එම සමාජවාදී වීරයා පිළිබඳ වූ දියසේන සිහිනය හුදු ජනප්‍රිය සමාජවාදය පිළිබඳ ඉඟියක් ව එවක ග්‍රන්ථ පාඨක තරුණ පිරිසෙහි විඥානයෙහි රෝපණය වූ බවය. එහෙයින් පශ්චාත් කැරලි සමයේ තරුණ රුචිකත්වය සමග මේ නවකථාවන්හි තේමා, කථානායක භූමිකා, අන්තර්ගතය හා දෘෂ්ටීන්

මනා ව ගැලපුණෙන් සාහිත්‍ය ප්‍රවණතාවක් වශයෙන් යථෝක්ත නවකථා ධාරාව නිරායාසයෙන් ම නැඟී ආවේය.

අක්කර පහ ප්‍රස්තුතය පසින් යථෝක්ත නවකතාවන්ට සහෘදාශයයක් පළ කරන අතර ම ගෝදාන් හා The Sword and the Sickle බඳු සමකාලීන භාරතීය නවකතාවන් හි අන්තර්ගතයන්ට බන්ධුත්වයක් දක්වයි. භූගෝලීය වශයෙන් සමීපස්ථ යථෝක්ත දේශය හා ශ්‍රී ලංකාව සතු දක්ෂිණ ආසියාතික කලාපීය සාම්‍යය එයින් ප්‍රකට කෙරේ. 1970 වර්ෂයෙන් ඇරඹෙන දශකයෙහි රචිත පූර්වයෙන් සාකච්ඡාවට පාත්‍ර වූ නවකතා මෙන් ම එය ද අදාළ යුගයේ සමාජාර්ථික සංස්කෘතික බලවේග පසුබිම් කර ගනිමින් ඒවායින් ප්‍රේරණයක් ලබා බිහි වූ කෘතියක් විනා හුදු ස්වාධීන ව ප්‍රාදුර්භූත වූවක් නොවේ. නිදහසින් පසු දේශජ කෘෂි ජන ජීවිතයෙහි නවෝදයක් උදා වූ සමයක කතුවරයාගේ උපකල්පනයට හා රුචිකත්වයටද අනුරූපී ව කෘෂක ජීවිතය උත්කර්ෂයට නඟමින් අක්කර පහ රචනා වී ඇත.

**ආන්තික සටහන්:**

1. i. රත්නායක එස්. මඩවල 1959.
   ii. ජයකොඩි ජයසේන 1971.
   iii. සුරවීර ඒ. වී. 1971.
   iv. සුරවීර ඒ. වී. 1975.
   v. නන්දිමිත්‍ර ඇරැව්වල 1984.
   vi. රත්නායක එස්. මඩවල 1989.
2. Williams, Raymond, 1975 (Reprint) The Long Revolution, Pelican Publishers, U.K., p 64-88.
3. රත්නායක එස්. මඩවල අක්කර පහ සවැනි මුද්‍රණය සැපයුණු ප්‍රස්තාවනාව V, VI, VII පිටු.
4. නිකනැටිය, එස්. බී. ආර්. ධර්මසේන කේ. වරණපාල ඩබ්ලිව්. 1986 කෘෂිකර්මය, මහාවංශය - නූතන යුගය ප්‍රථම භාගය (1935-1956) පි. 311.
5. Samarasinghe S. W. R. de A., 1980, "Post war Economic Development of Sri Lanka" Ceylon Studies Seminar, University of Peradeniya. p. 03.
6. කෘෂිකර්මය - මහාවංශය - නූතන යුගය, ප්‍රථම භාගය (1935-1956) පි. 311
7. එම.
8. ජයසූරිය ගාමිණී. 1977 දෙස රැකදෙන ගොඩ ජනපද සීමාසහිත ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ. පි. 23.
9. කෘෂිකර්මය - මහාවංශය - නූතන යුගය, ප්‍රථම භාගය (1935-1956) පි. 311.



10. Snodgrass D. R., 1966, Ceylon, An Export Economy in Transition, Economic Growth Centre, Yale University Press, p.155.
11. Central Bank of Ceylon, 1972, Survey on Agricultural Loans. Central Bank of Ceylon p. 05.
12. People Bank, Economic Review, 1983.Volume, 09, No. 05, Research Department People Bank, Colombo. p. 04.
13. Department of Agriculture.1987, A Review of Crop Researach Department of Agriculture Peradeniys. p.01.
14. Peoples Bank, Economic Review, 1982, Volume, 08, No 05, Research Department People Bank, Colombo, p.06.
15. Dutt, Sangeetha, 2003, Shyman Benegal, British Film Instuitute, London, p. 22.
16. Ibid, p.23.
17. GODAN. 1957, Translated by P. Lal and Jai Ratan, Bombay, p. 61. (අදාළ පාඨ පරිවර්තනය අපගෙනි.)
18. රත්නායක එස්. මඩවල අක්කර පහ, පි. 02.
19. එම, පි. 07, 08.
20. එම පි. 06.
21. එම, පි. 17.
22. එම. පි. 40.
23. එම. පි. 48.
24. එම. පි. 220.
25. එම. පි. 254.
26. එම ප්‍රස්තාවනාව, පි. VII.
27. The Painted Face, 199, Guptha, Chidanda, Poil Bokks p.v.t. L.t.f. New Delhi, p. 52.
28. ශ්‍රී ලංකාවේ දේශීය කෘෂිකාර්මාන්තය, පි. 104-105.
29. ජයකොඩි ජයසේන, 1997 (තෙවන මුද්‍රණය) අස්වැන්න, දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ, පි. 52.
30. එම. පි. 228-229.
31. සුරවීර ඒ. වී., 1971, හෙයියම්මාරුව, සීමාසහිත හංස ප්‍රකාශකයෝ, කොළඹ. පි. 227.
32. එම. පි. 230.
33. එම. පි. 231.
34. එම. පි. 232.
35. රත්නායක එස්. මඩවල, 1989, නිල්මල්විල, සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ. පි. 04.
36. එම. පි. 59-66.
37. එම. පි. 147.
38. එම. පි. 139.

39. එම. පි. 182.
40. එම. පි. 197.
41. සුරවීර ඒ. වී., 2001 මුද්‍රණය, නොයන් පුතුනි ගම හැරදා, කුරුලු පොත් ප්‍රකාශන, රාජගිරිය, පි. 68-69.
42. එම. පි. 98.
43. ශ්‍රී ලංකාවේ දේශීය කෘෂිකර්මය, ශ්‍රී ලංකාවේ හරිත විප්ලවය, පි. 76-104 හා 1972 සහ 1975 ඉඩම් ප්‍රතිසංස්කරණ, පි. 104-117.
44. එම. පි. 99-100.
45. එම. පි. 181-182.
46. නන්දිමිත්‍ර ඇරැව්වල, 1994 (දෙවැනි මුද්‍රණය) මිහිසරණ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ. පි. 150.
47. එම. පි. 168.

# මධ්‍යකාලීන සිංහල ක්‍රියාපදය පිළිබඳ බුත්සරණින් හෙළි වන තොරතුරු

වින්ධ්‍යා වීරවර්ධන

Ancient written records are the main sources of a historical linguistic study .There are two fold varieties of written records regarding ancient Sinhalese language, namely inscriptions and literary texts. In historical linguistics, Sinhalese language is classified into four periods due to structural variations. They are Sinhalese Prakrit era, Old Sinhalese era, Middle Sinhalese era and Modern Sinhalese era. Buthsarana, written by Vidya Chakravarthi is one of the significant literary texts belonging to middle Sinhalese era. Diachronically an investigation on Sinhalese verb will help to identify the gradual development of the Sinhalese verb system as well synchronically; special characteristics of the verb in middle Sinhalese era can also be found out. Therefore this study has value both from a historical linguistics and structural linguistics perspective. Finite verbs and nonfinite verbs, tenses, optative mood, causal verb, imperative mood, conditional mood, past participle, progressive form, verbal nouns, inflectional and derivational suffixes are among the special features that are discussed here.

ක්‍රියා පදය යනු වාක්‍යයක කේන්ද්‍රීය පදයයි. භාෂා අවධි ගත කිරීමේ දී මධ්‍යකාලීන සිංහල යුගය සේ ගැනෙන්නේ ක්‍රි. ව. 8 සිට ක්‍රි. ව. 13 දක්වා යුගයයි. බුත්සරණ ග්‍රන්ථය ලියැවී ඇත්තේ ද මේ අවධියේ දී ය. එහි කතුවරයා ලෙස සැලකෙන්නේ විද්‍යාචක්‍රවර්තීන් ය. බුත්සරණ ග්‍රන්ථය අධ්‍යයනයෙන් මධ්‍යකාලීන සිංහල යුගයේ ක්‍රියා පදය පිළිබඳ ව අනාවර්ණිත කරුණු සාකච්ඡා කිරීම මේ ලිපියෙහි අරමුණයි.

© කථිකාචාර්ය වින්ධ්‍යා වීරවර්ධන
සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු
මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 22 කලාපය, 2014/2015
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය